ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා වූ

මූල්‍ය වාර්තාවන්

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

NGJA/6/Annual Report/2016 2016-11-30

ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
82,"සම්පත් පාය"
රජමල්වත්ත පාර
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

2015 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනතේ 32 (3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) වගන්තිය අනුව පහත සඳහන් ලේඛන ඔබතුමා වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

1. 2015 වර්ෂය සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පාලන වාර්තාව.
2. විගණකාධිපති විසින් නිසි ලෙස විගණනය කරන ලද 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ ලාභාලාභ ගිණුම හා 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය
3. විගණකාධිපති වාර්තාව

ස්තුතියි
ඔබේ හිතවත්

අසංක වෙලගෙදර
සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

අපගේ දැක්ම

"ශ්‍රී ලංකාව - කුරුවින්ද අගනුවර"

අපගේ මෙහෙවර

ජාතික ධනය සහ කොටස්කරුවන්ගේ ප්‍රසාදය ඇති කිරීම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නීතිගත කිරීම තුලින් කර්මාන්තයේ විශිෂ්ඨත්වය ලඟාකර ගැනීම .

මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

2015 වර්ෂය

			පත්වූ දිනය	විශ්‍රාම ගත්දිනය
1	වජිර නාරම්පනාව මහතා	සභාපති	**30.01.2015**	**23.04.2015**
2	අරුණ ගුණවර්ධන මහතා	සභාපති	**23.04.2015**	**15.10.2015**
3	අසංක වෙලගෙදර මහතා	සභාපති	**18.11.2015**	
4	රාජා පීරිස් මහතා	සාමාජික	**30.01.2015**	
5	එන්. බී. වැගොඩපොල මහතා	සාමාජික	**30.01.2015**	
6	නවරත්න බණ්ඩාර මහතා	සාමාජික	**24.02.2015**	
7	එම්. පුවිහරන් මහතා	සාමාජික	**23.02.2015**	08.11.2015
8	බන්දුල එගොඩගේ මහතා	සාමාජික	**24.02.2015**	**28.10.2015**
9	ඒ. කේ. සෙනෙවිරත්න මහතා	සාමාජික	**03.03.2015**	
10	ඩී. එම්. රූපසිංහ මහතා	සාමාජික	**03.03.2015**	**20.11.2015**
11	එන්. ගොඩකන්ද මිය	සාමාජික	**23.04.2015**	
12	පී. බී. මල්ලව ආරච්චි මහතා	සාමාජික	**30.04.2015**	**25.10.2015**
13	බී. ජී. ඉන්දික කුමුදු සමරවීර මහතා	සාමාජික	**26.05.2015**	
14	ආචාර්ය අයි. දිසානායක මහතා	සාමාජික	**26.05.2015**	**15.10.2015**
15	ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මෙනෙවිය	සාමාජික	**20.11.2015**	
16.	ඉන්දිරා මල්වත්ත මෙනෙවිය	සාමාජික	**02.12.2015**	**31.12.2015**

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ 2015 වසර සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පාලන වාර්තාව

01. 2015 වසර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 21වන වසර සනිටුහන් කරයි. සමාලෝචිත වර්ෂය තුල එහි කාර්ය භාරය මෙහෙයවන ලද්දේ රත්නපුර පිහිටි ප්‍රධාන කාර්යාලය හා කොළඹ කාර්යාලය සහ රත්නපුරය, ඇහැලියගොඩ, මාතර, නාවුල සහ මොණරාගල ප්‍රාදේශීය ඒකක මෙන්ම කටුනායක මැණික් අපනයන මධ්‍යස්ථානය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති මැණික් හා ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානය මගිනි.

02. <u>අධිකාරියේ කර්තව්‍යයන්</u>

(අ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම;

(ආ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යෝජනා ක්‍රම ආරම්භ කර ක්‍රියාත්මක කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුලත හෝ ඉන් පිටත හෝ මැණික් හා ස්වර්ණාභරණ සඳහා වූ වෙළඳපොළ පුළුල් කිරීම සහ මැණික් හා ස්වර්ණාභරණ සඳහා ලෝක වෙළඳපොලේ ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම;

(ඈ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීමේ අදහසින් එම කර්මාන්තවලට අදාල සෑම අංශයකම සේවක පිරිස් වලට කාර්මික පුහුණුව, විශේෂයෙන් තාපයෝජනය සහ මැණික් කැපීම පිළිබඳව පුහුණුව ප්‍රවර්ධනය කිරීම සහ ඊට අනුග්‍රහය දැක්වීම;

(ඉ) අනාගත ගැණුම් කරුවන් තුල මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීමට අවශ්‍ය වියහැකි පියවරයන් ගැනීම;

(ඊ) නීති විරෝධි මැණික් ගැරීම සහ නීති විරෝධි ලෙස මැණික් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම වැලැක්වීම;

(උ) පතල් කැණීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකම් යම් ආරක්ෂා කිරීමක් හේතුවෙන් හෝ අන්‍යාකාරයකින් රජය වෙත රැඳී ඇති අවස්ථාවල රජයේ ඉඩම්වල හෝ ඒ මත හෝ රජය විසින් හෝ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් බැහැර කරන ලද ඉඩම්වල හෝ ඒ මත මැණික් පතල් කැණීමේ අයිතිවාසිකම් අන්සතු කරදීම පිළිබඳව වගකිවයුතු එකම බලධරයා වශයෙන් ක්‍රියා කිරීම;

(ඌ) මැණික් හා ස්වර්ණාභරණ අලෙවි කිරීමට අවශ්‍ය කාර්මික සහ වෙනත් උපදෙස් සහ යටිතල පහසුකම් සැපයීම;

(එ) යම් උපලේඛන ගත ලිඛිත නීතියක් යටතේ පාලනය සඳහා පමණක්,

i එය මැණික් හෝ මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් අදාල වනතාක් දුරට, හෝ

ii මේ පනත යටතේ අධිකාරියේ බලතල. කර්තව්‍ය සහ කාර්යය අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනතාක් දුරට එම නීතියේ කාර්ය පරිපාලනය කිරීම;

(ඒ) මැණික් සහ වටිනා ලෝහ වර්ග සහතික කිරීම සඳහා කාර්යාල පිහිටුවීම:

(ඔ) නිෂ්පාදිතයකුගේ ඉල්ලීම පිට, සපයනු ලබන ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ස්වර්ණාභරණ නියමිත ආකාරයකට විශේෂ ලකුණකින් මුද්‍රා තබන බවට වගබලා ගැනීම;

(ඕ) ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා මැණික් කර්මාන්තය, ස්වර්ණාභරණ කර්මාන්තය සහ රජයේ දෙපාර්තමේන්තු අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැගුම හා එම සම්බන්ධීකරණයක් ගොඩනැගීම හා එම සම්බන්ධීකරණ ක්‍රියාදාමයන් තවදුරටත් වර්ධනය කිරීමේ අතරමැදියා වශයෙන් කටයුතු කිරීම;

(ක) මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ සේවා නියුක්තයන්ගේ සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි සහ විශේෂයෙන් එම තැනැත්තන්ගේ ජීවිත සහ ශරීරාංග අනතුරු වලින් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවරයන් ගැනීම සහ ඒවා විධිමත් කිරීම සහ පාලනය කිරීම

03. මුල්‍යය

3.1 **ද්‍රවශීලතාවය :**

වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ රුපියල් මිලියන 43.548 ක්වූ අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 55.890 ක් විය. කල්පිරීමේ ආයෝජන (භාණ්ඩාගාර බිල්පත්) වල වසර ආරම්භයේදි රුපියල් මිලියන 482.640ක් වූ අතර එය වසර අවසානයේදී රුපියල් මිලියන 552.962 ක් විය.

වර්ෂය ආරම්භයේදී අනිකුත් මුලා වත්කම් වටිනාකම රුපියල් මිලියන 754.132 ක් වූ අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 779.742 ක් විය.

3.2 **ලාභදායකත්වය :**

	2010	**2011**	**2012**	**2013**	2014	2015
	රුපි.මිලි.	රුපි.මිලි.	රුපි.මිලි.	රුපි.මිලි.	රුපි.මිලි.	රුපි.මිලි.
මුළු අදායම	228.962	250.300	612.004	507.542	679.815	780.370
මුළු වියදම	261.929	222.488	261.076	387.458	364.873	458.385
ලාභය(බදුවලටපෙර)	(32.967)	27.812	350.928	120.084	314.942	321.985

04. මානව සම්පත්:

2015 වසර අවසානයේදී අධිකාරියෙහි කාර්ය මණ්ඩලය වෘත්තිකයන්ද ඇතුළුව 269 කින් යුක්ත විය. අප කන්ඩායමේ සාමාජිකයන්ගේ අඛන්ඩ වෘත්තීයමය සංවර්ධනය ඉහල ප්‍රමුඛස්ථානයේලා සලකනු ලබන අතර. මානව සම්පත් සංවර්ධනය කිරීමට අවස්ථා සලසාදීම අරහයා පියවර කිහිපයක් ගනු ලැබුණි.

05. බලපත්‍ර නිකුත් කිරීම :

මැණික් කර්මාන්තය සඳහා අධිකාරියෙහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් සහ ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පසුගිය වසර පහක සංඛ්‍යා සමග සසඳා පහත දැක්වේ.

	2009	**2010**	**2011**	**2012**	**2013**	**2014**	**2015**
මැණික්ගැරීමේබලපත්‍ර	3,970	4,061	4,687	5,956	6,565	5,928	5,151
මැණිත් වෙළඳ බලපත්‍ර	4,036	4,195	4,422	4,382	4,429	4.714	4,619
මැණික් කැපීමේ බලපත්‍ර	174	168	179	177	192	199	204
මැණික් වෙන්දේසි බලපත්‍ර	217	262	277	364	624	578	543
බලපත්‍ර එකතුව	**8,357**	**8,686**	**9,565**	**10,87**9	**11,810**	**11,419**	**10,517**

06. **අනවසර මැණික් ගැරීම් සහ පාරිසරික හාණි පාලනය :**

අනවසර මැණික් ගැරීම් සහ ඒතුලින් සිදුවන පාරිසරික විනාශයන් මැඩපැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියෙහි නිලධාරීන් වැටලීම් ගණනාවක් සිදුකරන ලදී. සමථ ගාස්තු තුලින් රුපියල් මිලියන 15.756 ක් උපයා ගන්නා ලදී.

අත්හැර දමා තිබු මැණික් පතල් වසා දැමීමට හා හාණියට පත් ගංඟා ඉවුරු පුනරුත්ථාපනය කිරීමට අධිකාරිය විසින් පියවර ගන්නා ලදී.

07. වර්ෂය තුලදී බගවන්තලාව වත්තෙහි මැණික් ගැරීමේ විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද අතර ඉන් රුපියල් මිලියන 40.746 ක අදායමක් උපයා ගන්නා ලදී. සීතාවක ගඟ සහ කළුගඟ හරනියාවක එවැනි ව්‍යාපෘති දෙකක් හඳුනාගන්නා ලද නමුත් යම් යම් සීමා කිරීම් නිසා මෙතෙක් ඒවා ක්‍රියාත්මක කල නොහැකි වී ඇත.

08. **සේවා සහ අනිකුත් සංවර්ධන කාර්යයන්:**

8.1 **අපනයන හා අපනයන සංවර්ධනය.**

--

1. පහත සඳහන් තෝරාගත් ජ්‍යාතන්තර වෙළඳපොලවල් සහ ප්‍රදර්ශන යන්හීදී "ශ්‍රී ලංකා මණ්ඩපය" සඳහා අනුග්‍රහය දැක්වීම සහ සංවිධානය කිරීම

   i. ජාත්‍යන්තර ස්වර්ණාභරණ ජපාන - ටෝකියෝ ජනවාරි 21 සිට 24 දක්වා
   ii. HKTDC ෂැංහයි ජාත්‍යන්තර දියමන්ති, මැණික් සහ මුතු ප්‍රදර්ශනය -මාර්තු 02 සිට 06 දක්වා
   iii. ෂැංහයි ස්වර්ණාභරණ ප්‍රදර්ශනය මැයි 06 සිට 10 දක්වා
   iv. ලාස් වේගාස් JCK ප්‍රදර්ශනය මැයි 29 සිට ජුනි 01 දක්වා
   v. සිංගප්පූරුවේ ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - ජුලි 02 සිට 05 දක්වා
   vi. ලන්ඩන් ජාත්‍යයන්තර ස්වර්ණාභරණ - සැප්තැම්බර් 06 සිට 08 දක්වා
   vii. හොංකොං ජාත්‍යන්තර මැණික් ප්‍රදර්ශනය සැප්තැම්බර් 16 සිට 20 දක්වා
   viii. ෂෙංෂෙන් රත්තරන් ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - නොවැම්බර් 06 සිට 08 දක්වා
   ix. චීන ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය නොවැම්බර් 28 සිට දෙසැම්බර් 02 දක්වා
   x. චීන ජාත්‍යන්තර රත්තරන්, ස්වර්ණාභරණ හා මැණික් වෙළඳ පොළ දෙසැම්බර් 11 සිට 14 දක්වා

2. වෙළඳ නියෝජිතයන් හට ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයන් සංවිධානය කිරීම.
   i. හොංකොං ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - සැප්තැම්බර් 18 සිට 22 දක්වා

3. මැණික් හා ස්වර්ණාභරණ අංශයේ සහභාගීත්වයෙන් පහත සඳහන් අවස්ථාවන් සංවිධානය කිරීම.
   i. අපනයන සංවර්ධන මණ්ඩලය මගින් මෙහෙයවන ලද දකුණු ආසියානු වෙළඳ භාණ්ඩපොළ සංවිධානය කිරීම.
   ii. "Expo Milan" 2015 ලෝක ප්‍රදර්ශනය.
   ii. ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සංවිධානය කරන ලද ෂැංහයි ශ්‍රී ලාංකික භාණ්ඩ ප්‍රවර්ධනය.

4. දේශීය වෙළඳ පොලවල් සහ ප්‍රදර්ශන සඳහා "ජා.මැ.ස්.අ.මණ්ඩපය " මගින් සංවිධානය හා අනුග්‍රහය දැක්වීම.

   i. ICA සංගමයෙහි "ජා.මැ.ස්.අ.මණ්ඩපය " 2015 මැයි 16 සිට 19 දක්වා පැවැත්වීම

   ii. 25 වන ශ්‍රී ලංකා ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය -“ FACET ශ්‍රී ලංකා 2015 " සැප්තැම්බර් 03 සිට 06 දක්වා

   iii. ඉතා විශාල සංචාරක ප්‍රවර්ධනය - දෙසැම්බර් 19 සිට 23 දක්වා

   iv. ශ්‍රී ලංකා මැණික් විද්‍යාඥයින්ගේ සංගමය මෙහෙයවන ලද “ ජුවෙල්ස් 2015 ” දෙසැම්බර් - 19 සිට 21 දක්වා

5. මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රජාවට ඔවුන්ගේ යන්ත්‍ර උපකරණ සහ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී අවශ්‍ය විදේශ ව්‍යවහාර මුදල් (ඇමරිකන්ඩොලර් 50,000 ටඅඩු) නිර්දේශ ලිපි නිකුත් කිරීම සහ මෙහෙයවීම.

6. මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන විදේශීය ව්‍යාපාරික ආයතන සහ පුද්ගලයින්ගේ ඉල්ලීම මත ඔවුනට ශ්‍රී ලංකාවේ රැදී සිටීමට අවශ්‍ය වීසා ලබාගැනීමට සහ වීසා අලුත් කරවා ගැනීමට නිර්දේශිත ලිපි අදාල අමාත්‍යාංශය වෙත නිකුත් කිරීම.

7. ශ්‍රී ලාංකික මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ නියුතු වුවන්හට වීසා ලබා ගැනීමේ ක්‍රියාවලියේදී අදාල රටවල් වල විසා නිලධාරීන් වෙත විසා ලිපි නිකුත් කිරීම.

8. ජා. මැ. ස්. අ. වෙනුවෙන් www.ngja.gov.lk නමින් වෙබ් අඩවියක් පවත්වාගෙන යාම.

9. ශ්‍රී ලංකාව තුල රාජ්‍ය අනුග්‍රහය මත පවත්වාගෙන යනු ලබන මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳ සංකීර්ණ සඳහා "ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරුව" මගින් පහසුකම් සැපයීම සහ ප්‍රවර්ධනය කිරීම.

10. ශ්‍රී ලංකාවේ කුඩා සහ මධ්‍යම පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයන් හට තමන්ගේ ස්වර්ණාභරණ අයිතමයන් විකිණීමට සහ ප්‍රවර්ධනයට “ රත්නදීප” නමින් ප්‍රදර්ශනාගාරය කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම.

11. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේදී භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය, ආයුධ, යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීමේදී සහන බදු අනුපාතයන්යටතේ ආනයනයට සහායවීම.

09. මැණික් හා ස්වර්ණාභරණ අපනයනය :

පසුගිය වසර පහක සහ සමාලෝචිත 2015 වසර තුල ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ අපනයනය පිළිබඳ තත්ත්වය පහත දැක්වෙන සංඛ්‍යා මගින් නිරූපනය වේ:

	2010 රු. මිලි.	2011 රු. මිලි.	2012 රු. මිලි.	2013 රු. මිලි.	2014 රු. මිලි.	2015 රු. මිලි.
මැණික් අපනයන	7,488.6	10,027.6	14,557	14,805	19,014	18,898
මැණික් - NSS විශේෂ ව්‍යාපෘතිය				1,915	3,179	2,792
ස්වර්ණාභරණ අපනයන	1,490.5	1,732.	2,444	2,194	2,467	2,192
ගෙවුඩ අපනයනය	136.5	146.7	225	122	140	102
දියමන්ති ප්‍රතිඅපනයනය	36,030.1	45,381.1	52,893	37,855	25,633	19,790
දියමන්තිආභරණ අපනයනය	312.5	375.8	324	229	258	315
මුළු අපනයනය	**45,458.20**	**57.663.5**	**70,443**	**57,210**	**50,691**	**44,089**

අසංක වෙළගෙදර
සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ***2016-02-26***

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය

	සටහන්	2015	2014
		රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	3	304,125,489.29	236,813,268
කල්බදූ ඉඩම් (භාවිතයට අයිති)	4	25,998.70	28,363
අස්පෘශ්‍ය වත්කම්	5	173,300.32	148,916
අනිකුත් වත්කම්	7	371,939,330.58	371,939,331
විකිණිය හැකි මූල්‍ය වත්කම්	8	1,200,010.00	1,200,010
ප්‍රාග්ධනිත කෙරීගෙන යන වැඩ		**1,728,008.22**	-
අනෙකුත් මූල්‍ය වත්කම්	14	20,000,000.00	-
ජංගම නොවන වත්කම් එකතුව		**699,192,137.11**	**610,129,887**
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	9	4,752,892.27	4,141,809
ලැබිය යුතු දෑ	10	41,901,499.68	28,905,148
කල්පිරෙන තෙක් රඳවා ගත් ආයෝජන (HTM)	11	552,962,321.53	482,639,856
තැන්පත් සහ අත්තිකාරම්	12	41,743,012.24	44,144,872
සේවක ණය සහ අත්තිකාරම්	13	11,682,492.51	14,108,003
අනිකුත් මූල්‍ය වත්කම්	14	779,742,162.53	754,132,625
මුදල් සහ මුදල් සමානයන්	15	55,890,007.28	43,547,995
ජංගම වත්කම් එකතුව		1,488,674,388.04	1,371,620,308
මුළු වත්කම්		**2,187,866,525.15**	**1,981,750,195**
ස්කන්ධ සහ බැරකම්			
ස්කන්ධ			
දායක ප්‍රාග්ධනය	16	30,000,000.00	30,000,000
මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල	17	26,748,972.71	27,365,928
ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල	18	46,558,762.67	37,504,763
මැණික් ත්‍යාග අරමුදල	19	38,150,634.89	36,033,910
මැණික් ප්‍රත්‍යාගණන සංචිත	20	355,074,648.00	355,074,648
ප්‍රත්‍යාගණන සංචිතය	21	52,845,424.11	52,945,425
රඳවා ගත් ඉපයුම්		735,816,080.16	615,579,700
ස්කන්ධඑකතුව		**1,285,294,522.54**	**1,154,504,374**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැදියාව	22	39,083,126.55	31,075,157
විලම්භිත බදු බැදියාව	6	20,063,344.00	16,923,372
-කල් බදු ගෙවීමේ බැදියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද ඉක්මවන	23.1	9,208.00	10,120
ජංගම් නොවන බැරකම් එකතුව		**59,155,678.55**	**48,008,649**

ජංගම බැරකම්

කල් බදු ගෙවීමේ බැදියාව - පියවීමේ කාලසීමාව	**23.1**	1,809.00	2,230
අවුරුද්ද නොඉක්මවන			
ගෙවිය යුතු දෑ	**24**	158,371,142.91	103,941,946
මැණික් ගැරීමේ තැන්පතු		390,976,994.66	369,912,429
ආපසු ගෙවිය යුතු තැන්පත් සහ අත්තිකාරම්	**25**	103,940,535.65	106,299,348
ව්‍යවස්ථාපිත ගෙවීම්	**26**	157,208,058.73	150,054,864
වෙන්කිරීම් සහ උපචිත වියදම්	**27**	32,917,783.11	49,026,356
		--------------------	----------------
ජංගම බැරකම් එකතුව		**843,416,324.06**	**779,237,172**
		--------------------	---------------
ස්කන්ධ සහ බැරකම් එකතුව		**2,187,866,525.15**	**1,981,750,195**
		===========	=========

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඇති බවට අධ්‍යක්ෂ (මූල්‍ය) සහතික කරයි.

අධ්‍යක්ෂ (මූල්‍ය)

මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස ගිණුම් ප්‍රතිපත්ති පිටු අංක 18 සිට 25 දක්වා සහ සටහන් පිටු අංක 26 සිට 35 දක්වා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබද වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන 2016 පෙබරවාරි 24 දින අනුමත කර ඒ වෙනුවෙන් අත්සන් කර ඇත.

....

සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි **අධ්‍යක්ෂ**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ශ්‍රී ලංකා රුපියල් වලින්

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශණය

	සටහන්	2015	2014
අයභාරය	**28**	580,394,662,.94	590,723,305,
අනිකුත් ආදායම්	**29**	92,356,673.80	27,871,684
පරිපාලන වියදම්	**30**	(147,716,986.70)	(136,149,399)
සේවක වියදම්	**31**	(218,311,400.46)	(172,334,751)
ප්‍රවර්ධන වියදම්	**32**	(92,358,312.19)	(56,388,916)
මෙහෙයුම් ලාභය		**214,364,637.39**	**253,721,924**
ශුද්ධ මුල්‍ය ආදායම	**33**	**107,620,076.83**	**61,220,312**
බදුවලට පෙර ලාභය		**321,984,714.22**	**314,942,235**
ඒකාබද්ධ අරමුදලට දායකය		**(75,000,000.00)**	**-**
බදුවලට පෙර ලාභය		**246,984,714.22**	**314,942,235**
ආදායම් බදු වියදම්	**34**	(130,925,283.44)	(145,347,542)
වර්ෂය සඳහා ලාභය		**116,059,430.78**	**169,594,693**

වර්ෂය සඳහා ලාභය	**116,059,430.78**	**169,594,693**
අනිකුත් විස්තීරණ ආදායම්	-	-
වරශය සඳහා මුළු විස්තීරණ ආදායම	**116,059,430.78**	**169,594,693**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

---

1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

1.1 පිළියෙල කිරීමේ පදනම

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි ("අධිකාරිය") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූලව පිළියෙල කර ඇත. මූල්‍ය වත්කම් ඒවායේ ඓතිහාසික පිරිවැය, ඒවායේ විකුණුම් මත ලබා ගත හැකි සත්‍ය වටිනාකමට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශන පිලියෙල කර ඇත.සමහර ගැටළු සහගත ගිණුම් ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන්වල (SLFRSs) නියම කර ඇති කරුණු වලට එකගව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරේ. ගිණුම්කරණ ප්‍රමිත අදාල කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමණාකාරීත්වයේ අවශ්‍යතාවය මත තීරණයකර යොදාගැනේ. සංකීර්ණත්වයෙන් විවිධ වූ තීක්ෂණ ලෙස තීරණ ගැනීමේ කරුණු වලදී හෝ මූල්‍ය ප්‍රකාශන වලට වැදගත් වන කරුණු භාරගැනීම හෝ ඇස්තමේන්තු කිරීම ගිණුම් වල හෙළිදරව් කර ඇත.

1.2 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්

අනිකුත් විදියකින් දක්වා නොමැති නම් පහත සඳහන් කර ඇති ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට පරිවර්තනය කිරීම ආරම්භක දිනයට පැවති මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කරන ලද කාල පරිච්ජේද වලට අදාලව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන වල ස්ථිරව යොදාගෙන ඇත.

මෙම වර්ෂයේදී මනාලෙස ඉදිරිපත් කිරීම සහ සැසඳීමට හැකිවන පරිදී අවශ්‍ය අවස්ථා වලදී පසුගිය වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

1.3 විදේශීය මුදල් පරිවර්තනය කිරීම

1.3.1 ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය සහ ක්‍රියාකාරීත්වය

මූල්‍ය ප්‍රකාශයන්හී අඩංගු ගණු දෙණු සහ ශේෂයන් ආයතනය ක්‍රියාත්මක වනු ලබන මූලික ආර්ථික පරිසරයේදී භාවිතා කරනු ලබන මුදල් මත ගණනය කර ඇත. අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කර ඇත.

1.3.2 **ගණුදෙණු සහ ශේෂයන්**

විදේශීය මුදල් ගණුදෙණු එකී ගණුදෙණුව සිදුවන අවස්ථාවේ පවතින විදේශ මුදල් හුවමාරු අනුපාතයන් භාවිතා කරමින් ක්‍රියාකාරීත්වයේ පවතින මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ. එකී ගණුදෙණු පියවීමේදී ඇතිවන විදේශ මුදල් හුවමාරු ලාභය හෝ අලාභය සහ වර්ෂය අවසානයේ පරිවර්තනයන් එදිනට පවතින විදේශ මුදල් හුවමාරු වටිනාකම මත මූල්‍ය වත්කම් සහ විදේශ මුදල් මත ඇතිවන බැදීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හී හඳුනාගැනේ.

ක්‍රමක්ෂය පිරිවැය වෙනස් වීම් වලට අදාල මුදල් පරිවර්තිත වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශන වලදී හඳුනාගැනේ.

1.3.3 **දේපල, පිරියත හා උපකරණ**

කළමනාකාරීත්වය අදහස් කරන පරිදී වත්කම් යම් ස්ථානයක පිහිටුවීමට හෝ ක්‍රියාකාරීත්වයට ගෙන ඒමට දරනු ලබන ඍජුවම ආරෝපිත කල හැකි ඕනෑම පිරිවැයක් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකමට ඇතුලත්ව හඳුනාගැනේ.

1998 වර්ෂයට පෙර අත්පත්කර ගත් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන වටිනාකමට පිළියෙල කර ඇත. ප්‍රත්‍යාගණන වටිනාකම ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනයේදී පැවති සාධාරණ වටිනාකම ලෙස අධිකාරිය විසින් භාරගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ තීරණය කරන ලද පිරිවැය සමුච්චිත ක්ෂවීම් අඩුකිරීමෙන් පසුව භාණ්ඩ පාඩු ලෙස සටහන් කරනු ලැබේ. 1998 වර්ෂයෙන් පසුව අත්පත් කර ගන්නාලද දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂවීම් අඩු කිරීමෙන් පසුව භාණ්ඩ පාඩු ලෙස ගණනය කරනු ලැබේ.

වත්කමක් මිලදී ගැනීමෙන් පසුව දරනු ලබන පිරිවැය එම අයිතමය මගින් අධිකාරියට ගෙනදෙන අනාගත ආර්ථික වාසි සමග ඒකාබද්ධව විශ්වාසයකින් ගණනය කල හැකි නම් එයද වත්කමෙහි වටිනාකම ලෙස හඳුනාගනු ලබන අතර, අනිකුත් සියළුම අලුත් වැඩියා සහ නඩත්තු සඳහා දරනු ලබන ගාස්තු එකී වියදම දරනු ලබන කාලපරිච්ඡේදයට අදාල විස්තීරණ ආදායම් ප්‍රකාශන වල දක්වනු ලැබේ.

ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර අනෙකුත් වත්කම් සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරනු ලබන අතර පහත සඳහන් අයුරු වත්කමෙහි ඇස්තමේන්තුගත ජීව ආයුකාලය මත එහි ක්ෂයවීම් බෙදාහරිනු ලැබේ.

අයිතමය	**ආයු කාලය**	**ක්ෂය අනුපාතය**
ගොඩනැගිලි	වසර 30 – 50	2% - 3.33%
වෙන්කිරීම්	වසර 3	33.33%
පර්යේෂණාගාර හා ස්වර්ණාභරණ පරික්ෂණ උපකරණ	වසර 10	10%
ලී බඩු සහ කාර්යාල උපකරණ	වසර 10	10%
රථ වාහන	වසර 4	25%
පරිගණක උපකරණ	වසර 5	20%
අනිකුත් වත්කම්	වසර 10	10%

වත්කමෙහි ඇස්තමේන්තුගත වටිනාකමට වඩා ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම වැඩිවන්නේ නම්, වත්කමෙහි ඉදිරියට ගෙන එන වටිනාකම පියවාගත හැකි වටිනාකමට ලියා හරිනු ලැබේ.

1.3.4. අස්පෘශ්‍ය වත්කම්

පරිගණක වැඩ සටහන් හා පරිගණක පද්ධති අත්පත්කර ගැනීමට හා ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා දරනු ලබන පදනම මත පරිගණක වැඩ සටහන් හා පරිගණක පද්ධති ප්‍රාග්ධනීත කරනු ලැබ්. මිලදී ගත් අස්පෘශ්‍ය වත්කම් ඒවා මිලදී ගැනීමට දරන ලද වියදමෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හාණි වූ වටිනාකම අඩුකිරීමෙන් පසු දක්වනු ලැබේ. මෙම පිරිවැය පහත සඳහන් අයුරු ඇස්තමේන්තු ගත ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ**.**

පරිගණක පද්ධති	වර්ෂ 5	20%

පරිගණක පද්ධති නඩත්තු සඳහා දරනු ලබන පිරිවැය වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

1.3.5. කල් බදු ඉඩම්

කල් බදු යටතේ දරනු ලබන ඉඩම් පලමුවෙන්ම බදු ගෙවීම් වටිනාකම වර්ධනය වන ණය අනුපාතයන් යටතේ වට්ටම්කර එයට ආරම්භක මූලික පිරිවැය හා ඉන් පසුව දරන්නට සිදුවන පිරිවැය එකතුකර වර්තමාන වටිනාකම සමාන වන පරිදි ගණනය කරනු ලබන අතර

කල්බදු ඉඩම් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. කල්බදු ඉඩම් වල වටිනාකම කල් බදු කාලසීමාව තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

කල් බදු ඉඩම්	වර්ෂ 30	3.33%

1.3.6. මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීම

සෑම වාර්තාකරනු ලබන කාල පරිච්චේදයක් අවසානයේදීම අධිකාරිය විසින් දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල අගය පිළිබඳ විමසා බැලෙන අතර, එම වත්කම්වල අගය අඩු වීමක් පෙන්නුම් කෙරේද යන්න තීරණය ලැබේ. එවැනි ලක්ෂණයක් පෙන්නුම් කෙරේ නම්, එම වත්කම් මගින් ආවරණය කරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කර අගය අඩුවීම තීරණය කෙරේ.

විකුණුම් පිරිවැය වත්කමේ සාධාරණ අගයෙන් අඩු කිරීමෙන් පසු ආවරණය වන වටිනාකම වැඩි නම් අගය භාවිතයට ගැනේ. භාවිතා කිරීමේ ඇස්තමේන්තු අගය, අනාගත අස්තමේන්තු මුදල් ප්‍රවාහ වර්තමාන මුදල් ප්‍රවාහ වර්තමාන වටිනාකම අනාගත බදු වට්ටම් අනුපාතයෙන් ගණනය කරන අතර එම මුදල් වල වර්තමාන තක්සේරු අගය හා විශේෂ අවධානම් තක්සේරු කරනු ලැබුවද එය අනාගත මුදල් ප්‍රවාහයට ගැලපීම් නොකෙරේ.

වත්කමෙහි දරනු ලබන වටිනාකම ආවරනය කරගත හැකි ඇස්තමේන්තු වටිනාකමට අඩුනම්, දරනු ලබන වටිනාකම ආවරණය කරගත හැකි වටිනාකම දක්වා වත්කමෙහි වටිනාකම අඩු කරනු ලැබේ. අගය අඩුවිමේ පාඩුව විස්තීර්ණ මුදල් ප්‍රකාශයන්හීදී හදුනාගනු ලැබේ.

1.4. මූල්‍ය වත්කම්

1.4.1. වර්ගීකරණය

අධිකාරියෙහි මූල්‍ය වත්කම් හදුනාගැනීම අනුව පහත සඳහන් අයුරු වර්ගීකරණය කරනු ලැබේ

i. ණය හා ලැබිය යුතු දෑ
ii. විකුණාගත හැකි දෑ (AFS)
iii. කල්පිරීම දක්වා රදවා ගන්නා වු ආයෝජන(HTM)

i. ණය හා ලැබිය යුතු දෑ

ක්‍රියාකාරි වෙළඳ පොලෙහි මිල නියම නොකරන ලද, ස්ථිර හෝ තීරණය නොකරන ලද මූල්‍ය වත්කම් වලින් පැවත එන දෑ ණය හා ලැබිය යුතු දෑ වේ. වාර්තා කරනු ලබන කාල පරිච්චේදය ඉක්මවා මාස 12 ට වැඩි කාලයකින් කල් ඉකුත් වන දෑ හැර අනිකුත් ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම් වල ඇතුලත්ව ඇත. වාර්තා කරනු ලබන කාල පරිච්ජේදය අවසානයේ අධිකාරියෙහි පැවති වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ, රාජ්‍ය සුරැකුම් පත් නැවත මිලදී ගැනීම්, තැන්පත්, සේවක ණය හා මුදල් සහ මුදල් සමානදෑ වලින් ණය හා ලැබිය යුතු දෑසමන්විතවේ.

ii. විකුණාගත හැකි දෑ (AFS)

මෙකී වර්ගයට නියම කරන ලද හෝ වෙනත් කිසිදු වර්ගයකට වර්ගීකරණය නොකරන ලද නමුත් පැවත එන මූල්‍ය වත්කම් විකිණිය හැකි ආයෝජන යටතට ගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ජේදයෙන් පසු මාස 12 ක් තුල විකිණීමට තීරණය නොකරන ලද හෝ කල් පිරෙනු ලබන ජංගම වත්කම් ගණයට නොවැටෙන දේ මෙයට ඇතුලත්වේ.විකිණිය හැකි මූල්‍ය වත්කම් දිගුකාලීන ලැයිස්තගත නොවූ ස්කන්ධ ආයෝජනවලින් සමන්විතවේ.

iii. කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන(HTM)

තීරණය කරනු ලබන හෝ ස්ථිර ගෙවීමක් ලබන සහ ස්ථිරව කල් පිරෙනු ලබන ණය හා ලැබිය යුතු දෑ කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජනලෙස තීරණය කරනු ලැබේ.අධිකාරිය විසින් දැනට කල් පිරෙන තෙක් රඳවාගනු ලබන, යහපත් දැක්මක් ඇති නම් එම ආයෝජනයන් කල්පිරීම තෙක් රඳවා ගන්නා ආයෝජන ලෙස වර්ගීකරනය කරනු ලැබේ.

මෙම ආයෝජනයන් වාර්තා කරනු ලබන කාල පරිච්ජේදය අවසන් වීමෙන් පසු මාස 12ක කාලයක් ඉක්මවන කාලයක් තුල කල් පිරෙනු ලබන ඒවා ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කෙරේ. අධිකාරිය දැනට භාණ්ඩාගාර බිල්පත් වල කර ඇති ආයෝජන මේ යටතට ගැනේ.

1.4.2 හඳුනා ගැනීම් සහ මූලික ගණනය කිරීම්

ණය හා ලැබිය යුතුදෑ පිළිබඳ ගණුදෙණුවක් ආරම්භවන දිනයේදී අධිකාරිය විසින් එයමූල්‍ය වත්කම් ලෙස හඳුනාගැනේ. අධිකාරිය මූල්‍ය උපයෝජනය සඳහා ගිවිසුම් වලට එලඹී එහි එක් පාර්ශවකරුවෙකු වන දිනයේදී අනිකුත් මූල්‍ය වත්කම් හඳුනාගැනේ.

මූල්‍ය වත්කමක් එහි සාධාරණ අගයට පෙන්නුම් නොකෙරේ නම්, ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගය කෙලින්ම හුවමාරු කිරීමේ පිරිවැය ස්වභාවයද සැලකිල්ලට ගෙන මූල්‍ය වත්කම් මූලිකව ගණනය කරනු ලැබේ.

මූල්‍ය වත්කම් කල් පිරීම හෝ හුවමාරු කිරීම සිදුවන අවස්ථාවේදී මුදල් ප්‍රවාහයන් ලැබීම හෝ හිමිකම් ඇතිවන අවස්ථාවේදී නැවත හඳුනා ගැනෙන අතර පසුව අධිකාරිය මූල්‍ය වත්කම්වල අයිතිය මත සියළු අවධානම් සහ යහපත් ප්‍රථිඵලයන් මාරු කරනු ලැබේ.

1.4.3 දෙවනුව ගණනය කිරීම්

i. ණය සහ ලැබිය යුතු දෑ

මූලික හඳුනාගැනීමෙන් පසුව ණය හා ලැබිය යුතු දෑ බල පැවැත්වෙන පොලී අනුපාතයන් මත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය භාවිතාකර හාණි හා පාඩු සඳහා වෙන් කිරීම් අඩුකර දෙවනුව ගණනය කෙරේ.

ii. විකුණාගත හැකි දෑ (AFS)

මූලික හඳුනාගැනීමෙන් පසුව ලැයිස්තු ගත නොවූ ආයෝජන විකුණාගතහැකි මූල්‍ය වත්කම් ලෙස වර්ග කෙරෙන අතර එහි වර්තමාන වටිනාකම නියත වශයෙන් ඇස්තමේන්තු කල නොහැකි විට පිරිවැයෙන් වෙළඳ පල අගය නිසා ඇතිවන අලාභය අඩු කිරීමෙන්ද පසු ගණනය කරනු ලැබේ.

iii. කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන(HTM)

කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය, බල පැවැත්වෙන පොලී අනුපාතයන් භාවිතා කරමින් වූ ගණනය කිරීම් හාණි සහ පාඩු අඩු කිරීමෙන් පසුව ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේදී හා හුවමාරු පිරිවැය මත වට්ටම් සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ.

1.4.4 මූල්‍ය වත්කම් මත හානි හා පාඩු

I. වත්කම් ක්‍රමක්ෂය පිරිවැය මත දැක්වීම

මූල්‍ය වත්කම් වල වටිනාකම හානි වී තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය විසින් තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කමක අගය අඩුවී තිබේනම් එම හානි වීමෙන් සිදුවූ අඩුවීම අඩංගුව ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේ නම්ද, වත්කමක් හඳුනාගැනීමෙන් පසු සිද්ධීන් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස එය ඇතිවී ඇත්නම් සහ එකී පාඩු අවස්ථාව හෝ අවස්ථාවන් අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රමාණයන්ට බලපෑමක් සිදු කෙරෙන විට එය පිළිගත හැකි ලෙස ඇස්තමේන්තු කෙරේ.

ණය හා ලැබිය යුතු දෑ කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජනයන් ඒවායේ හිලව් වන පිරිවැයට ගනු ලබන අතර වත්කම දරනු ලබන වටිනාකම සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම (ඇතුලත් නොවූ අනාගත බැර පාඩු හැර) අනුව අලාභය ගණනය කර එම මූල්‍ය වත්කම බල පවත්වන සත්‍ය පොලී අනුපාතය මත වට්ටම් කරනු ලැබේ.මූල්‍ය වත්කම්වල දරනු ලබන අගයෙන් හඳුනාගනු ලබන පාඩු අඩුකර එය විස්තීරණ ආදායම් ප්‍රකාශයන්ට ගණු ලැබේ.

පසු කාල පරිච්ඡේදයේදී හානි පාඩු වටිනාකම අඩු වන්නේ නම්ද හානි පාඩු සිදුවීමෙන් පසු අඩුවීම කෙලින්ම බලපානු ලබන්නේ නම්ද, එය හඳුනාගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන් මගින් පෙර හඳුනාගත් හානි පාඩු වටිනාකම යථා තත්ත්වයට ගෙන එනු ලැබේ.

II විකුණාගත හැකි දෑ (AFS)

මූල්‍ය වත්කමට හානි පාඩු සිදුවී ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය එය තක්සේරු කරනු ලැබේ. ලැයිස්තුගත නොකල ආයෝජනයන් සඳහා, ආයෝජනයන්ගේ වටිනාකම සැලකිය යුතු හෝ දිගින් දිගටම පිරිහීම පිළිබඳ සාක්ෂි ඇත්නම් වත්කමේ අගය අඩු කරනු ලැබේ. මිල නියම නොකල ආයෝජනයන් සඳහා එවැනි සාක්ෂි තිබේනම්, මූල්‍ය වත්කම දරනු ලබන වටිනාකම සහ වෙනත් එවැනි වත්කමක් සඳහා වර්තමාන ඉපයීම් වෙළඳපල අනුපාතය මගින් අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන් වට්ටම්කිරීමෙන් ලැබෙන වර්තමාන අගය අතර වෙනසගණනය කර හානි පාඩු සිදුවූ වටිනාකම ගණනය කරනු ලැබේ.එවැනි හානි පාඩු යථා තත්ත්වයට පත් කරනු නොලැබේ.

1.5 **භාණ්ඩ තොග**

පලමු ලැබීම් පලමු නිකුත් කිරීම් (FIFO)පදනම මත පිරිවැය තීරණය කර ශුද්ධ උපලබ්ධි අගය හෝ ගත්මිල යන දෙකෙන් අඩු අගය මත තොගයන් දක්වා ඇත. පාරිභෝගික භාණ්ඩ සහ ලිපිද්‍රව්‍ය වලින් තොග සමන්විතවේ.

1.6 **ලැබිය යුතු දෑ**

ලැබිය යුතු දෑ මුලින්ම එහි සත්‍ය වටිනාකම් මත (ඉන්වොයිස් අගය) හදුනා ගැනීමද, ඉන් පසුව මුල් ඉන්වොයිස් වටිනාකම කෙටි කාලයක් තුල ආපසු ලැබේයයි බලාපොරොත්තුවෙන් වෙළද පල වටිනාකම සලකා එයින් හාණි සදහා අඩු කිරීමද සිදු කරන අතර, මුදල් වල කාලීන වටිනාකම සැලකිල්ලට නොගැනේ.

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදිම ආපසු ලැබිය යුතු දෑ වල වෙළද පල වටිනාකම වෙනස්වීම් වලට අදාල සාක්ෂි තිබේදැයි අධිකාරිය විසින් තීක්ෂණව තක්සේරු කරනු ලැබේ. අධිකාරියෙහි පසු ගිය අත්දැකිම් අනුව මුදල් එකතු කිරීමේ සහ ලැබීම් ප්‍රමාද සංඛ්‍යාව, ලැබීම්වල අගය අඩුවීමක් තිබේනම් එම හාණි පාඩු ඇතුලත් වන බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් ලැබිය යුතු දෑ හාණි පාඩු සඳහා වෙන වෙනම තක්සේරු කරනු ලැබේ.

1.7 **මුදල් හා මුදල් සමානදෑ**

මුදල් හා මුදල් සමානදෑ තුල අතැති මුදල්, බැංකු ඒක්ෂණ තැන්පතු, මාස තුනක් හෝ ඊට පෙර කල් පිරෙනු ලබන ආයෝජන සමග අනිකුත් ඉතා ඉහල ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන මුලික කල්පිරීමේ වටිනාකම් මත මුදල් ප්‍රවාහ තුල ඇතුලත් කර ඇත.

1.8 **දායකත්ව ප්‍රාග්ධනය**

ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයයන් මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය වේ.

1.9 මූල්‍ය බැරකම්

අධිකාරියෙහි මූල්‍ය බැරකම් අනිකුත් මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. අධිකාරියෙහි අනිකුත් මූල්‍ය බැරකම් වලට ගෙවිය යුතු දෑ, බලපත්‍ර සඳහා ලැබූ අත්තිකාරම්, මැණික් ගැරීමේ තැන්පතු හා අනිකුත් තැන්පත් ලැබීම් ඇතුලත්වේ. මූල්‍ය වත්කම් මුහුණත වටිනාකමට කෙලින්ම හුවමාරු පිරිවැයක් වෙත්නම් එයද ඇතුලත්ව මුලින්ම හඳුනා ගැනේ. මූලික හඳුනාගැනීමෙන් පසුව කෙටි කාලයක් තුලදී ආපසු ගෙවීමට බලාපොරොත්තුවන හිග මුදල්වල මූලික වටිනාකම අනුව ගණනය කර හඳුනා ගැනීම සිදුකෙරේ.

කල් පිරීම, අවලංගු කිරීම, ගිවිසුම් ගත බැඳීම් වලින් නිදහස් වීම වැනි අවස්ථා වලදී අධිකාරිය නැවත මූල්‍ය බැරකම් හඳුනා ගැනේ.

1.10 ප්‍රවර්තන හා විලම්භිත බදු

කාල පරිච්ඡේදය තුල දරන ලද බදු වියදම් වල වර්තමාන හා විලම්භිත බදු අඩංගුවේ. අනිකුත් විස්තීරණ ආදායම් අයිතමයන් ප්‍රමාණයන් හැර විස්තීරණ ආදායම් ප්‍රකාශයන් මගින් ආදායම් බදු හඳුනා ගැනේ. මෙම කරුණෙහිදී පවා විස්තීරණ ආදායම් ගිණුම මගින් බදු හඳුනාගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසානයේදී පවත්නා බදු නීතියට අනුව අධිකාරියෙහි ක්‍රියාකාරීත්වය මගින් උත්පාදනය වන බදු අයවන ආදයම් පදනම මත වර්තමාන බදු ගණනය සිදු කෙරේ. කළමණාකාරීත්වය විසින් සුදුසුතම බදු පදනම යටතේ බදු අධිකාරීන් වෙත ගෙවිය යුතු යැයි බලාපොරොත්තුවන බදු සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.
මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම් හා වගකීම් ඒවායේ දරනු ලබන වටිනාකම මත පැන නගින තාවකාලික වෙනස අනුව විලම්භිත බදු වගකීම හඳුනාගැන්. බදු සඳහා ගනන් ගැනෙන ලාභ හෝ පාඩු මගින් ගිණුම් වලට බල පෑමක් සිදු නොවන ගණුදෙණු සිදුවන අවස්ථා වලදී හැර වත්කම් හා වගකීම් සම්බන්ධ ගණුදෙණු සිදුවන අවස්ථාවලදී විලම්භිත බදු ගිණුම් ගත නොකෙරේ. කාල පරිච්ඡේදය අවසන් වන දිනයට බල පවත්වන බදු අනුපාතයන් භාවිතයෙන් වත්කම් හා වගකීම් වල ඉදිරියට ගෙන යන නිරවුල් කලයුතු ශේෂය හා අපේක්ෂිත උපලබ්ධි මුදල මත පදනම්ව විලම්භිත බදු මුදල ගණනය කෙරේ.
අනාගත බදු වත්කම් හා වගකීම් වර්තන බදුවලට එරෙහිව හිලව් කිරීම සඳහා නීතිමය බලාත්මක අයිතියක් තිබේනම්, බදු අධිකාරීන් විසින් ආදායම් බදු පැනවීමේදී ඒ හා සම්බන්ධ වේනම් විලම්භිත බදු වගකීම් වර්තන බදු වගකීම් වලට එරෙහිව ලියා හැරේ.

1.11 සේවක ප්‍රතිලාභ

(අ) නිශ්චිත දායකත්ව සැලසුම්

සේවය අවසන් කිරීමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ වෙනුවෙන් අධිකාරිය විසින් ස්ථිර දායකත්ව මුදලක් වෙනත් ආයතනයක තැන්පත් කිරීම නිශ්චිත දායකත්ව සැලසුමට අයත්වේ. අධිකාරිය තවදුරටත් දායකත්ව ගෙවීම සඳහා නීතිමය හෝ වෙනත් සම්බන්ධිත බැදීම් කිසිවක් නොමැත. සේවක ප්‍රතිලාභ වියදම් ගෙවිය යුතු අවස්ථාවේදී එම දායකයන් හඳුනාගැනේ.
සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයන්ගේ දළ සේවා පාරිශ්‍රමිකයන් මත 15% දායක මුදලක්ද, සේවා නියුක්තියන්ගේ භාර අර මුදල සඳහා දළ සේවා පාරිශ්‍රමිකයන් මත 3% ක දායක මුදලක්ද අධිකාරිය විසින් දරනු ලැබේ.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේදී නිශ්චිත ප්‍රතිලාභ වල එදිනට පවතින වටිනාකම මත අධිකාරියෙහි නිශ්චිත ප්‍රතිලාභ බැදීම් සම්බන්ධව ඇති බැදීයාව ගණනය කෙරේ. යෝජිත ඒකක වගකීම් ක්‍රමය අනුගමනය කරමින් ගණනය කිරීම් පාරිතෝෂික සූත්‍රය භාවිතා කරමින් සිදුකර නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදියාව ගණනය කරනු ලැබේ. සේවකයන්ගේ වර්තමාන හා පසුගිය සේවා කාලය සහ උපයාගත් වැටුප අනාගත ඇස්තමේන්තු ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකම ගණනය මත නිශ්චිත ප්‍රතිලාභ බැදීම් තීරණය කරනු ලැබේ.

ගණනය කිරීම් වල වෙනස්වීම් මත පැන නගිනු ලබන ලාභය හෝ පාඩුව ඒවා පැන නගිනු ලබන කාල පරිච්ඡේදය, වර්තමාන සේවා පිරිවැය හා පොලිය විස්තීරණ ආදායම් ප්‍රකාශ වලට ඇතුලත්වේ.
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් සඳහා පිටතින් අරමුදල් සපයා ගණු නොලැබේ.

(ඇ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

සේවකයා විසින් සපයන ලද සේවය පදනම් කරගෙන ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂා කරනු ලබන වට්ටම් නොකරන ලද මුදල මත කෙටිකාලීන සේවක ප්‍රතිලාභ බැදීම ගණනය කරනු ලැබේ.

1.12 ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්

නිශ්චිත වශයෙන් ගණනය කල හැකි හා ආර්ථික සම්පත් ඉවතට ගලායාමෙ සම්භාවිතාවක් ඇති බව පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස නීතිමය අයුරින් හෝ වටහා ගතහැකි පරිදී වර්තමාන බැදීම් අධිකාරියට ඇතිවිට නීතිමය ඉල්ලීම් මත ප්‍රතිපාදන හා අනිකුත් ක්‍රියාකාරි වියදම් හදුනාගැනේ.

වාර්තාකරනු ලබන දිනය වන විට පිළිගත හැකි සාක්ෂි තිබේනම් හා වර්තමාන බැදීම් සමග අවධානම සහ අවිනිශ්චිතාව සම්බන්ධ වී ඇතුලත්ව තිබේ නම්, වර්තමාන බැදීම් පියවීම සඳහා අවශ්‍යවන ඇස්තමේන්තුගත වියදම් අනුව ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

සම්පත් ඉවතට යාමේ සම්භාවිතාවයක් නොමැති නම් සියළු අසම්භාව්‍ය බැරකම් මුල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

1.13 අදායම් හදුනා ගැනීම

ලැබිය යුතු හා ලැබූ මුදල්වල සාධාරණ අගය සැලකිල්ලට ගෙන ආදායම් ගණනය කරන අතර මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීම, බලපත්‍ර ගාස්තු, නිර්යාත කොමිස් හා සේවා සැපයීම් වෙනුවෙන් ලැබිය යුතු මුදල්, එකතු කල අගය මත බදු (VAT) හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) අඩු කිරීමෙන්පසු දක්වා ඇත. ආදායම් නිශ්චිත ලෙස ගණනය කල හැකි විටදී සහ අධිකාරිය වෙත අනාගතයේදී ආර්ථික පහසුකම් ලගා වේනම් ආදායම් හදුනා ගැනේ.

අධිකාරිය විසින් ප්‍රධාන වර්ගයේ සේවා සැපයිම් වෙනුවෙන් වු ආදායම් හදුනාගැනීම පහත සඳහන් පරිදී යොදා ගැනේ.

(අ) මැණික් ගැරීමේ අයිතිය අලෙවිය (ඉඩම් වෙන්දේසි)

මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීමේදී මැණික් ගැරීම සඳහා ඉඩම් කැබලි වෙන්කර බලපත්‍ර ලබාදීම,මිල ගණන් කැදවීමේ ක්‍රමය අනුගමනය කර සිදුකෙරේ. මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදී අදායම් හදුනාගැනේ.

(ආ) බල පත්‍ර ගාස්තු - මැණික් කැපීමේ සහ මැණික් අලෙවි බලපත්‍ර

බල පත්‍රයේ කාල සීමාව අනුව ඍජු ක්‍රමය යටතේ බලපත්‍ර ගාස්තු ආදායම් හදුනාගැනේ.

(ඇ) බල පත්‍ර ගාස්තු - මැණික් ගැරීමේ, යන්ත්‍ර මගින් මැණික් ගැරීමේ (BACO)සහ මැණික් වෙන්දේසි බලපත්‍ර

මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදි බලපත්‍ර ගාස්තු ආදායම් හදුනාගැනේ.

(ඇ) මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත කොමිස් - (නිර්යාත සේවා ගාස්තු සහ කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු)

භාණ්ඩ නිර්යාත කිරීමට සූදානම් කල අවස්ථාවේදී නිර්යාත කොමිස් ආදායම් ලෙස හදුනාගැනේ.

(ඉ) සේවා

මැණික් ඉඩම් පරික්ෂා කිරීම වෙනුවෙන් වූ ආදායම් ගෙවීම් ලැබෙන අවස්ථාවේදී ආදායම් ලෙස හදුනා ගැනේ.

(ඊ) කුලී ආදායම්

බදු කොන්දේසි සැලකිල්ලට ගෙන උපචිත පදනම මත කුලී ආදායම හදුනා ගැනේ.

(උ) පොළී ආදායම්

ක්‍රියාත්මක වන පොලී ක්‍රමය මත පොළී ආදායම් හඳුනාගැනේ.

(ඌ) ලාභාංශ ආදායම්

ගෙවීම් කිරීම තහවුරු කරනු ලබන අවස්ථාවේදී ලාභාංශ ආදායම් හදුනාගැනේ.

(එ) දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු

ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු තීරණය කිරීම එම වත්කමෙහි දරනු ලබන අගය සහ විකුණා ලැබෙන මුදල සමග සැසඳීමෙන් පසුව විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හීදී සිදුකෙරේ.

1.14 වියදම්

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයට අදාලව ලාභ ඉපයීම සඳහා ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාමට දරනු ලබන සියළු වියදම් ඇතුලත්වේ.

1.15 වාර්තා කරනු ලබන කාලයට පසු සිදුවීම්

වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයට පසු සිදුවීම් වල ප්‍රමාණාත්මක බව සලකා අවශ්‍ය පරිදි ගැලපීම් සිදුකර මුල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

1.16 බැදීම්

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ පවතින සියළු ප්‍රමාණාත්මක බැදීම් හදුනාගෙන මුල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

1.17 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණයන්

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී කළමණාකාරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හදුනා ගැනීමට සහ ඒවා ගණනය කිරීම සඳහා බොහෝ තීරණයන් මත ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදුකර ඇත.

i. මූල්‍ය ප්‍රකාශනවලට බොහෝ බලපෑම් ඇති කරනු ලබන ගිණුම් ප්‍රමිත භාවිතා කිරීමේදී පහත සඳහන් වැදගත් තීරණයන් ගනු ලැබීය.

(අ) **විලම්භිත බදු වත්කම් හඳුනාගැනීම**

වත්කම්වල අනාගත ප්‍රයෝජනයට ගතහැකි අගයට එරෙහිව අනාගතයේ බදු ආදායමක් ලැබීමේ සම්බන්ධතාවයක් පවතීනම් එම වත්කම් එම ප්‍රමාණයට පමණක් විලම්භිත බදු වත්කම හඳුනාගැනේ.

ii. වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම සහ ගණනය කිරීම් වලදී බොහෝ වැදගත් සිදුවීම් සඳහා ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

(අ) **ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය**

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම ක්ෂය වන වත්කම්වල ප්රයෝජනවත් ආයු කාලය ඇස්තමේන්තු කිරීමේදී එම වත්කමෙහි යෝජිත ආර්ථික භාවිතය පදනම්ව කළමනාකාරිත්වය සලකා බලනු ලැබේ. මෙම ඇස්තමේන්තු වලදි තාක්ෂණිකව අභාවයට යෑම පිළිබඳ පරිගණක උපාංග හා පරිගණක මෘදුකාංග වල අවිනිශ්චිතතාවයක් පවතී.

(ආ) **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

උපකල්පනයන් ගණනාවක් භාවිතා කරමින් හා සාධක ගණනාවක් සැලකිල්ලට ගනිමින් යෝජිත ඒකක බැර පදනම මත නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැඳීම් වල වර්තමාන වටිනාකම තීරණය කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැඳීම් සහ ශුද්ධ පිරිවැය උපකල්පනය කිරීමේදී යොදාගන්නා වට්ටම් අනුපාතයන් සටහන් (22) මගින් හෙළිදරව් කර ඇත. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වර්තන වටිනාකමට මෙම උපකල්පනයන්ගේ වෙනස්වීම් බලපානු ලැබේ.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියශ්‍රී ලංකා රුපියල් වලින්
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

2.

	දායක ප්‍රාග්ධනය	මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල	ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල	මැණික් ත්‍යාග අරමුදල	අනිකුත් සංචිත	මැණික් ප්‍රත්‍යාගණන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	රඳවාගත් ඉපයුම්	එකතුව
2014 ජනවාරි 01 දිනට ශේෂය	**30,000,000**	**26,927,498**	**29,059,263**	**36,511,450**	**-**	**355,074.648**	**52,945,425**	**440,155,420**	**970,673,704**
සාධාරණ අගයට ගැලපීම්	-	-	-	-	-	-	-	-	-
වර්ෂය සඳහා ලාභය								169,594,693	169,594,693
අනිකුත් විස්තීරණ ආදායම්	-	-	-	-	-	-	-	-	**-**
විස්තීරණ ආදායම් එකතුව	-	-	-	-	-	-	-	-	169,594,693
පසුගිය වර්ෂයට ගැලපීම්								5,829,587	5,829,587
වර්ෂය සඳහා දායකත්වය/ (උපයෝජනය)	-	438,430	8,445,500	(477,540)		-	-	-	8,406,390
අගය අඩුවීමට ගැලපීම්									
2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	**30,000,000**	**27,365,928**	**37,504,763**	**36,033,910**	**-**	**355,074,648**	**52,945,425**	**615,579,700**	**1,154,504,374**
සාධාරණ අගයට ගැලපීම්	-	-	-	-	-	-	-	-	-
වර්ෂය සඳහා ලාභය								116,059,431	116,059,431
අනිකුත් විස්තීරණ ආදායම්									
විස්තීරණ ආදායම් එකතුව									**116,059,431**
පෙර වර්ෂය සඳහා ගැලපීම්								4,176,949	4,176,949
වර්ෂය තුල දායකත්වය/ (උපයෝජනය)		(616,955)	9,054,000	2,116,725					10,533,769
හාණි පාඩු සඳහා ගැලපීම්									
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**30,000,000**	**26,748,973**	**46,558,763**	**38,150,635**	**-**	**355,074,648**	**52,945,425**	**735,816,080**	**1,285,294,522**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2015	2014
බදු වලට පෙර ලාභය	321,984,714	314,942,235
ගැලපීම්		
ක්ෂයවීම්	29,476,142	27,371,312
අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක් ක්ෂය	122,866	208,875
විශ්‍රාම පාරිතෝෂික බැදීම්	8,389,972	8,259,512
ලාභාංශ	(180,000)	(540,000)
ස්ථාවර වත්කම් ඉවත් කිරීමෙන් වූ ලාභ	44,850	-
පොලී ආදායම්	(107,645,069)	(61,245,077)
කල්බදු ගෙවීම් බැදීම් වලදී ඇතිවූ මුල්‍ය පිරිවැය	24,992	24,765
භාවිතයට අයිති ඉඩම් වල ක්‍රමක්ෂය	2,364	2,364
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය	252,220,831	**289,023,987**
කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්		
තොග	**(611,083)**	**(1,981,404)**
ලැබිය යුත දෑ	**(12,966,352)**	**(19,509,014)**
තැන්පතු සහ අත්තිකාරම්	**2,401,860**	**(11,435,352)**
ඉදිරි ගෙවීම්	**-**	**-**
සේවක ණය සහ අත්තිකාරම්	**2,425,510**	**(448,254)**
ගෙවිය යුතු දෑ	**54,429,197**	**25,438,445**
මැණික් ගැරීමේ තැන්පතු	**21,064,566**	**43,238,645**
තැන්පතු සහ අත්තිකාරම් ලැබීම්	**(2,358,812)**	**9,846,592**
වෙන් කිරීම් සහ උපචිත වියදම්	**(15,499,687)**	**29,188,337**
මෙහෙයුම් වලින් ජනිත මුදල්	**301,076,030**	**363,361,983**
පාරිතෝෂික ගෙවීම්	**(382,002)**	**(1,180,212)**
ගෙවූ බදු	**(133,574,741)**	**(61,318,311)**
මෙහෙයුම් වලින් ජනිත ශුද්ධ මුදල්	**167,119,287**	**300,863,461**

ආයෝජන ක්‍රියාකාරකම් තුලින් වූ මුදල් ප්‍රවාහය		
යන්ත්‍ර පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම	(103,247,343)	(44,428,902)
ස්ථාවර වත්කම් ඉවත් කිරීමේදි ලැබීම්	36,700	-
ලාභාංශ ලැබීම්	180,000	540,000
අනිකුත් මුල්‍ය වත්කම් වල ශුද්ධ ආයෝජනයන්	(34,761,405)	(114,756,127)
භාණ්ඩාගාර බිල්පත් වල ශුද්ධ ආයෝජන	(135,157,740)	(266,259,974)
පොලී ලැබීම්	107,645,069	61,245,077
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද (භාවිතා කරන ලද) ශුද්ධ මුදල්	**(165,304,719)**	**(363,659,927)**
මුල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ		
මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල් උපයෝජනය	(616,955)	438,431
කල්බදු සඳහා වූ වගකීම් සමථය	(26,325)	(26,235)
ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලට දායකය	9,054,000	8,445,500
මැණික් ත්‍යාග අරමුදලට දායකය	2,116,724	(477,540)
මුල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**10,527,444**	**8,380,065**
මුදල් සහ මුදල් සමානයන් ශුද්ධ වෙනස්වීම	**12,342,012**	**(54,416,401)**
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමානයන්	**43,547,995**	**97,964,396**
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමානයන් (සටහන5)	**55,890,007**	**43,547,995**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා මුල්‍ය ප්‍රකාශන වලට සටහන්

3. දේපල, පිරියත හා උපකරණ පිරිවැයට	2015 ජනවාරි 01 දිනට	එකතු කිරීම්	ඉවත් කිරීම්	2015 දෙසැම්බර් 31 දිනට
බැදීම් වලින් නිදහස්				
ඉඩම්	37,941,670	-	-	37,941,670
ගොඩනැගිලි	160,176,966	-	-	160,176,966
සවිකිරිම් සහ උපකරණ	14,156,310	335,275	-	14,491,585
ලීබඩු	12,440,795	627,318	(52,500)	13,014,613
කාර්යාල උපකරණ	17,938,624	854,535	(215,922)	18,577,237
පරිගණක	24,507,498	1,838,800	(235,383)	26,110,915
පර්යේෂණාගාර උපකරණ	23,700,997	368,200	-	24,069,197
මැණික් කැපිමේ උපකරණ	403,475	-	-	403,475
ස්වර්ණාභරණ උපකරණ	148,200	-	-	148,200
තත්ත්ව මුද්‍රා උපකරණ	29,618,033	93,573,215	-	123,191,248
ගෙවුඩ යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ	8,292,358	-	-	9,292,358
රථ වාහන	102,932,088	5,650,000	-	108,582,088
යතුරු පැදි	100,000	-	-	100,000
පාපැදි	37,344	-	-	37,334
මැණික් කැපීමේ පොත්	5700	-	-	5,700
කල් බදු ඉඩම්	159,205	-	-	159,205
	432,559,254	**103,247,343**	**(504,805)**	**533,326,303**

ක්ෂයවීම්	2015 ජනවාරි 01 දිනට	වර්ෂයට අය කිරීම්	ඉවත් කිරීම්	2015 දෙසැම්බර් 31 දිනට
ගොඩනැගිලි	40,410,973	4,530,180	-	44,941,153
සවිකිරීම් සහ උපකරණ	11,622,429	470,754	-	12,903,183
ලීබඩු	8,806,606	797,377	(46,497)	9,557,486
කාර්යාල උපකරණ	9,151,750	1,444,695	(141,375)	10,455,070
පරිගණක	15,372,834	3,111,162	(235,382)	18,248,614
පර්යේෂණාගාර උපකරණ	11,955,080	1,796,570	-	13,751,650
මැණික් කැපිමේ උපකරණ	311,915	32,200	-	344,115
ස්වර්ණාභරණ උපකරණ	148,200	-	-	148,200
තත්ත්ව මුද්‍රා උපකරණ	17,815,418	927,469	-	18,742,888
යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ	8,292,358	-	-	8,292,358
රථ වාහන	66,835,282	16,364,799	-	87,602,020
යතුරු පැදි	100,000	-	-	100,000
පාපැදි	35,451	-	-	34,451
මැණික් කැපීමේ පොත්	-	936	-	936
පර්යේෂණාගාර උපකරණ	**190,858,297**	**29,476,142**	**(423,254)**	**224,313,124**

ශුද්ධ ධාරන අගය	2015 දෙසැම්බර් 31 දිනට	2014 දෙසැම්බර් 31 දිනට	2014 ජනවාරි 01
බැදීම් වලින් නිදහස්			
ඉඩම්	37,941,670	37,941,670	37,941,670
ගොඩනැගිලි	113,260,324	119,765,993	117,084,862
සවිකිරීම් සහ උපකරණ	2,398,403	2,533,882	2,233,044
ලීබඩු	3,457,128	3,634,190	3,186,581
කාර්යාල උපකරණ	8,122,167	8,786,874	6,768,767
පරිගණක	7,862,300	9,134,664	6,410,875
පර්යේෂණාගාර උපකරණ	10,317,547	11,745,917	10,630,688
මැණික් කැපිමේ උපකරණ	59,360	91,560	123,760
ස්වර්ණාභරණ උපකරණ	-	-	-
තත්ත්ව මුද්‍රා උපකරණ	104,448,361	11,802,615	9,105,243
යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ	-	-	16,492
රථ වාහන	20,980,068	36,096,806	38,958,045
යතුරු පැදි	-	-	-
පාපැදි	1,883	1,883	2,819
පුස්තකාල පොත්	4,764	5,700	6,900
කල්බදු ඉඩම්	159,205	159,205	159,205
	309,013,179	**241,700,958**	**232,628,951**
අගය අඩුවීමට ගැලපීම්	(4,887,690)	(4,887,690)	(4,887,690)
	304,125,489	**236,813,268**	**227,741,261**

මාර්ග සංවර්ධන අධිකාරියේ හෙළි දරව් කිරීම් අනුව ඇහැළියගොඩ ඉදිකරන ලද ගොඩනැගිල්ල නැවත විකුණා මුදලක් අයකර ගත නොහැකි බැවින් සාධාරණ අගය හාණි සඳහා වූ ප්‍රතිපාදන වලට මාරු කරන ලදී.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

4 **කල්බදු ඉඩම් - ඉඩම් භාවිතය සඳහා අයිතිය**

කල් බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම ණයට ගැනීම් සඳහා වූ වර්ධනය වන වට්ටම් අනුපාතය මත ගණනය කිරීමෙන් පසු වටිනාකමට කල්බදු ඉඩම් ඉඩම් භාවිතය සඳහා අයිතිය ගණනය කරනු ලැබේ.

ඉඩම් භාවිතය සඳහා දරනවටිනාකම	**2015**	**2014**
ප්‍රාග්ධනිත අගය		
ජනවාරි 01 දිනට	**70,909.00**	**70,909**
ඇතුලත් මුලික පිරිවැය	-	-
වර්ෂයතුල ප්‍රාග්ධනිත කිරීම්	-	-
දෙසැම්බර් 31 දිනට	**70,909.00**	**70,909**
ක්‍රමක්ෂය		
ජනවාරි 01 දිනට	**42,546.30**	**40,182**
වර්ෂය තුල ක්‍රමක්ෂය වීම	2,364.00	2,364
දෙසැම්බර් 31 දිනට	**44,910.30**	**42,546**
දරනු ලබන වටිනාකම	**25,998.70**	**28,363**

ඉඩම්වල කල්බදු අයිතිය 1997 නොවැම්බර් මස ආරම්භ වි අවරුදු 30 දක්වා වේ. කල්බදු කොන්දේසි අනුව 2026 නොවැම්බර් දක්වා වාර්ෂිකව ඉඩම් භාවිතය සඳහා වූ කල්බදු අයිතිය සංක්‍රාන්ති අවධිය වූ (2011 ජනවාරි 01) සිට ඉදිරි කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

5	අස්පෘශ්‍ය වත්කම්	2015 දෙසැම්බර් 31 දිනට	එකතු කිරීම්/ඉවත් කිරීම්	2015 ජනවාරි 01 දිනට
	5.1 පිරිවැයට			
	පරිගණක මෘදුකාංග	2,677,306.00	147,250	2,530,056
	එකතුව	2,677,306.00	147,250	2,530,056

		2015 දෙසැම්බර් 31 දිනට	වර්ෂය සඳහා වැය	2015 ජනවාරි 01 දිනට
	5.2 ක්‍රමක්ෂය			
	පරිගණක මෘදුකාංග	2,504,005.68	122,866	2,381,140
	එකතුව	**2,504,005.68**	**122,866**	**2,381,140**

5.3 දරණ ශුද්ධ අගය	2015 දෙසැම්බර් 31 දිනට	2014 දෙසැම්බර් 31 දිනට
පරිගණක මෘදුකාංග	173,300.32	148,916

6	විලම්භිත බදුවත්කම්/(වගකීම්)	2015	2014
	ජනවාරි 01 දිනට ශේෂය	(16,923,372.00)	(16,062,221)
	ගැලපීම්	(3,139,972.00)	(861,151)
	දෙසැම්බර් 31 දිනට ට ශේෂය	**(20,063,344.00)**	**(16,923,372)**

7	**අනිකුත් වත්කම්**		**2015**	**2014**
	රළු ගල් සහ සින්තටික් ගල්		96,683	96,683
	ප්‍රදර්ශන මැණික් ගල්		371,842,648	371,842,648
	මැණක් සහ මැණික් ආයතන වලට අත්තිකාරම් ගෙවීම්		200,000	200,000
			372,139,331	**372,139,331**
	හාණි පාඩු සඳහා වෙන්කිරිම්		(200,000)	(200,000)
			371,939,331	**371,939,331**

8	**විකිණිය හැකි (AFS) මූල්‍ය වත්කම්**		**2015**	**2014**
	ලැයිස්තු ගත නොකල ආයෝජන	(සටහන් 8.1)	**1,200,010**	**1,200,010**
	8.1 ලැයිස්තු ගත නොකල ආයෝජන	කොටස් සංඛ්‍යාව		
	සීමා සහිත ලංකා එක්සත් පුවත්පත් සමාගම	200,000	200,000	200,000
	ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා පුද්ගලික සමාගම	100,000	1,000,000	1,000,000
	එල්ජීඑල් පුද්ගලික සමාගම	1	10	10
			1,200,010	**1,200,010**
9	**භාණ්ඩ තොග**			
	පාරිභෝගික භාණ්ඩ		2,340,774.90	1,974,996
	මැණික් - ගෙවුඩ මධ්‍යස්ථානය		183,547.54	183,548
	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය තොග		2,228,569.83	1,983,265
			4,752,892.27	4,414,809

10	**ලැබිය යුතු දෑ**		
	ලැබිය යුතු දෑ	41,065,511.47	29,201,426
	හාණි පාඩු සඳහා වෙන්කිරීම	(1,407,972)	(1,407,972)
		39,657,539.47	**27,973,454**
	අනිකුත්	2,243,960.21	1,111,694
		41,901,499.68	**28,905,148**
11	**කල් පිරෙන තෙක් වූ ආයෝජන (HTM) ක්‍රමක්ෂය පිරිවැය මත දරන වටිනාකම**		
	භාණ්ඩාගාර බිල්පත්	552,962,321.53	482,639,856.21
12	තැන්පතු සහ අත්තිකාරම්		
	පොදු තැන්පත්	37,024,684.46	36,407,684.46
	අනිකුත්	14,525	19,525.00
	නිවාස කුලී අත්තිකාරම්	-	-
	ඉඩම් වෙන්දේසි 40%	-	-
	ආරක්ෂිත තැන්පතු	34,500.00	34,500.00
	සැපයුම්කරුවන්ට ගෙවූ අත්තිකාරම්	6,103,249.78	9,117,109.34
		43,176,959.24	45,578,818.80
	හාණි පාඩු සඳහා වෙන්කිරීම්	(1,433,947.00)	(1,433,947)
		41,743,012.24	44,144,872
13	**සේවක ණය සහ අත්තිකාරම්**		
	අත්තිකාරම්	66.961.28	48,750.39
	වැටුප් රහිත නිවාඩු	142,030.27	256,843.63
	වාහන ණය	53,033.31	219,983.67
	රෙදිපිළි ණය	224,000.24	205,000.24
	ආපදා ණය	11,196,467.41	13,377,424.73
		11,682,492.51	**14,108,003**

14	**අනිකුත් මූල්‍ය වත්කම්**	2015	2014
	ස්ථාවර තැන්පත්	764,439,445.50	739,722,904.47
	රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල	15,302,717.03	14,409,720.61
		779,742,162.53	**754,132,625**

15	**මුදල් සහ මුදල් සමාන දෑ**		
	මුදල් හා බැංකු ශේෂයන් - ශ්‍රී. ලං. රු.	34,442,239.93	30,079,962.54
	බැංකු ශේෂය (විදේශ ව්‍යවහාර මුදල්)	562,167.35	3,468,032.12
	සුළු මුදල්	-	-
	භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන	20.885,600.00	10,000,000.00
		58,890,007.28	43,547,994

16. **දායක ප්‍රාග්ධනය**

ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයයන් මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය වේ.

17. **මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල**

මැණික් කර්මාන්තයේ නියුතු සේවකයන්ගේ ජීවිත අවධානම නිසා ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අධිකාරිය විසින් 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 1 කොටසේ 14(එන්) වගන්තියට අනුකූලව 2008 වනතුරු මැණික් ගරන්නන්ගෙන් අරමුදල් එකතු කරන ලදී.

18. **ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල**

ස්වර්ණාභරණ කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනය වෙනුවෙන් 2007 අයවැය යෝජනා අනුව ස්වර්ණාභරණ නිෂ්පාදකයින් ගෙන් වාර්ෂික ලියාපදිංචි ගාස්තුව වූ රු.5,000 බැගින් වූ මුදලින් මෙම අරමුදල සංයුක්තවේ.

19. මැණික් ත්‍යාග අරමුදල

1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ iv කොටසේ 52 වගන්තියේ අවශ්‍යතාවය අනුව අධිකාරිය වෙත ලැබෙන අපරාධ වෙනුවෙන් අදාල පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු සහ දඩ මුදල් දඩ අරමුදල වෙත බැර කිරීමෙන් මෙම අරමුදල සමන්විතවේ.

අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේක අංක 824 උපදෙස් අනුව වැටලීම් කණ්ඩායම්වලට සහ සේවකයන්ට ත්‍යාග පිරිනැමීම සඳහා මෙම අරමුදල නඩත්තු කෙරේ.

20. මැණික් ප්‍රත්‍යාගණන සංචිත

මැණික් ප්‍රදර්ශන වලට ඉදිරිපත් කරනු ලබන මැණික් ගල් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇතිවන අතිරික්ත වලින් සමන්විතවේ.

21. ප්‍රත්‍යාගණන සංචිත

ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම තුලින් ඇතිවන ප්‍රත්‍යාගණන අතිරික්තයන් ගෙන් ප්‍රත්‍යාගණන සංචිතය සමන්විත වන අතර ප්‍රත්‍යාගණනය කරන ලද එකිනෙක වත්කම් ඉවත් කිරීමේදී එම වත්කමට අදාල ප්‍රත්‍යාගණන අතිරික්ත වටිනාකම රඳවාගත් ඉපයුම් වලට මාරු කරනු ලැබේ.

22.

විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්	2015	2014
ජනවාරි 01 දිනට ශේෂය	31,075,156.25	23,995,857
විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම්හඳුනාගැනීමසටහන් 22.1	8,389,972.00	8,259,512
2014 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම්	(382,002.00)	(1,180,212)
2015 වර්ෂයේ ගැලපීම්	-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය	**39,083,126.55**	**31,075,157**

22.1 **විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම්හඳුනාගැනීම**		
පොලී වියදම	3,042,258.00	2,142,830
වර්ෂය තුල අයකිරීම්	1,891,744.00	1,495,199
උපකල්පනයන්ගේ වෙනස්වීම් තුලින් පැන නගින (ලාභ)/ අලාභ	3,455,970.00	4,621,563
	8,389,972.00	**8,259,512**

විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කිරීමේදී අධිකාරියේකළමනාකාරීත්වය වඩාත් උචිත විචල්‍ය ඇස්තමේන්තු පදනම් කරගෙන මෙම උපකල්පනයන් සංවර්ධනය කෙරේ.

භාවිතා කරනු ලබන මූලික උපකල්පනයන් පහත දැක්වේ

වට්ටම් අනුපාත	10	9
අනාගත වැටුප් වැඩිවීම් සාමාන්‍ය වේතන (%)	1.3	1.3
සේවක පිරිවැටුම් සාධකය (%)	2.2	2.4
විශ්‍රාම යන වයස (අවුරුදු)	60	60

දිගුකාලීන රජයේ බැදුම්කර වෙළද අනුපාත පදනම මත වට්ටම් අනුපාත තීරණය කරනු ලැබේ.

23	**කල්බදු ගෙවීම් සඳහා වු වගකීම**	**2015**	**2014**
	දළ වගකීම	-	-
	ජනවාරි 01 දිනට	546,914.00	573,239
	වර්ෂය තුල හඳුනා ගැනීම්	-	-
	වර්ෂය තුල ගෙවීම්	(26,325.00)	(26,325)
	දෙසැම්බර් 31 දිනට	**520,589.00**	**546,914**
	මූල්‍ය පිරිවැය		
	ජනවාරි 01 දිනට	534,564.00	559,329
	වර්ෂය තුල හඳුනා ගැනීම්	-	-
	වර්ෂයතුලවිස්තීරණ ආදායම තුල මූල්‍ය පිරිවැය හඳුනා ගැනීම	(24,992.00)	(24,765)
	අනාගත කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය	**509,572.00**	**534,564**
	දෙසැම්බර් 31 දිනටශුද්ධ බැදීම්	**(11,017.00)**	**(12,350)**

23.1 වගකීම් වර්ගීකරණය

වර්ෂයක් තුල පියවියයුතු		
දළවගකීම්	26,995	26,995
අනාගතකාලපරිච්ඡේදසඳහා මූල්ය පිරිවැයප්‍රතිපාදනය	(25,186.00)	(24,765)
	1,809.00	**2,230**

වර්ෂය ඉක්මවූ	-	-
පියවීම වර්ෂ දෙක සහ පහ අතර	-	-
දළ වගකීම්	157,950.00	144,787
අනාගත කාලපරිච්ජේද සඳහා මූල්‍යපිරිවැය ප්‍රතිපාදනය	(153,262.00)	(139,881)
	4,688.00	**4,869**
පියවීම වර්ෂපහ ඉක්මවූ		
දළ වගකීම්	335,643.00	375,132
අනාගත කාල පරිච්ජේද සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය	(331,123.00)	(369,881)
	4,520.00	**5,251**
වර්ෂයක් ඉක්මවා පියවිය යුතු වගකීම් එකතුව	**9,208.00**	**10,120**
දෙසැම්බර් 31 දිනට ශුද්ධ වගකීම් එකතුව	**11,017.00**	**12,350**

24 **ගෙවිය යුතු**

ණය හිමියෝ	155,565,953.92	98,136,434
කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවාගත් මුදල්	2,568,872.60	2,568,873
අනිකුත්	236,316.39	3,236,639
	158,371,142.91	**103,941,946**

25 **තැන්පතු සහ අත්තිකාරම් ලැබීම්**	2015	2014
අත්තිකාරම් ලැබීම්	18,603,950.00	16,659,550.00
බලපත්‍ර ගාස්තු	-	-
සේවක ආරක්ෂිත තැන්පතු	74,500.00	64,500.00
ගණුදෙණු කරුවන්ගේ අත්තිකාරම්	15,896.26	15,896.26
සේවකයන්ගේ වැඩිපුර අයකර ගැනීම්	2,066.00	1,500.00
ඉඩම් ආරවුල් තැන්පතු	63,344,856.91	58,283,065.01
ටෙන්ඩර් තැන්පතු	4,569,500.00	14,836,500.00
ලෝක වෙළඳ මධ්‍ය. වෙලඳ කුටි රඳවා ගැනීම්	16,923,769.48	16,032,239.67
මැණික් කෞතුකාගාර අරමුදල	125,997.00	125,997.00
නිර්යාත කොමිස් තැන්පතු	280,000.00	280,00.00
	103,940,535.65	**106,299,348**

26	**ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ**		2015	2014
	සංස්ථාපිත බදු	(සටහන් 26.1)	102,866,235.99	116,716,513.55
	එකතුකල අගය මත බදු		4,824,074.35	4,527,830.92
	රඳවාගත් බදු		(11,743,760.65	(11,743,760.65)
	රඳවාගත් මැණික් වෙනදේසි බදු 2%		56,901,930.93	37,374,163.13
	ජාතිය ගොඩනැගීමේ බදු		1,858,935.16	917,913.52
	මුද්දර ගාස්තු		2,618,983.99	2,299,667.27
			(118,341.04)	(37,464.04)
			157,208,058.73	**150,054,864**

26.1 සංස්ථාපිත බදු

ජනවාරි 01 දිනට ශේෂය	116,716,513.55	60,105,954.59
වර්ෂය සඳහා වර්ථන බදු	127,866,235.62	146,716,514.35
වර්ෂය තුල ගෙවීම් - පසුගිය වසර බැදීම් පියවීම	(123,574,741.18)	(46,318,312.39)
ස්ව තක්සේරු ගෙවීම්	(10,000,000.00)	(30,000,000.00)
බදු බැර පියවීම් - ආර්ථික සේවා ගාස්තු	-	-
- රඳවාගත් බදු	-	-
- ජාතිය ගොඩනැගීමේ බදු	-	-
පසුගිය වර්ෂය සඳහා වූ අධි/(ඌණ) වෙන්කිරීම් මත ගැලපීම	(8,141,772.00)	(13,787,643.00)
	102,866,235.99	**116,716,514**

27	**වෙන්කිරීම් සහ උපචිත වියදම්**		
	නිත්‍යානුකූල හිමිකම් සඳහා වෙන්කිරීම්	-	195,300.00
	උපචිත වියදම්	32,917,783.11	48,831,055.67
		32,917,783.11	**49,026,356**

28	**ආදායම්**	2015	2014
	ඉඩම් වෙන්දේසි - රජයේ ඉඩම්	9,107,087.50	-
	ඉඩම් වෙන්දේසි - ඉඩම් ප්‍ර.කොමි.	229,489,656.17	22,553,180
	සේවා සහ බලපත්‍ර අභියාචන ගාස්තු	607,556.00	688,517
	මැණික් ගැරීමේ බලපත්‍ර ගාස්තු	33,643,453.03	35,767,987

වෙළඳාම් බලපත්‍ර ගාස්තු	35,728,410.40	33,627,320
ත්‍යාග සහ සාම්පල් සඳහා සේවා ගාස්තු	419,000.00	353,115
මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත සේවා ගාස්තු	113,956,667.16	126,129,260
මැණික් කැපීමේ බලපත්‍ර ගාස්තු	349,980.00	239,320
ගෙවුඩ නිර්යාත සේවා ගාස්තු	6,708,634.66	11,279,538
LDO ඉඩම් සහ බණිජ බද්ද	3,472,067.90	4,630,300
දඩ මගින් ආදායම්	15,756,005.10	12,182,105
මැණික් වෙන්දේසි බලපත්‍ර	713,716.50	924,248
මැණික් පරීක්ෂා කිරීමේ ගාස්තු	10,226,725.10	12,672,514
තත්ත්ව මුද්‍රා කාර්යාලයේ ආදායම්	3,345,765.59	3,535,422
බලපත්‍ර පිටපත් ගාස්තු	135,223.22	138,780
කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු	5,359,927.27	8,965,237
මැණික් පාර්සල් නිශ්කාශණයෙන් ආදායම්	1,830,300.00	1,549,194
විදේශ විනිමය භාර ගැනීමේ බලපත්‍ර	1,200.00	100
පාරිසරික ආරක්ෂණය	1,770,000.00	101,080
BACO සේවා ගාස්තු	16,179,677.89	20,311,166
පරීක්ෂණ ගාස්තු	38,768,272.48	58,513,809
ත්‍රීමාන කාඩ් සහ වර්ණ	1,635,085.95	1,933,542
මැණික් වෙළඳාම	40,746,001.02	227,935,818
මැණික් ගැරීමේ දඩ	10,354,250.00	6,711,,750
	580,394,662.94	**590,723.305**

29	**අනිකුත් ආදායම්**	2015	2014
	විවිධ ආදායම්	511,835.11	3,427,415
	ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ සහ රත්නපුර වෙළඳසැල්	29,062,220.07	22,222,597
	පොත් අලෙවිය	10,230.00	8,100
	ලාභාංශ	180,000.00	540,000
	කුලී ආදායම්	951,110.00	869,650
	වෙන්දේසි අයිතම වලින් ලද මුදල්	1,838,150.00	46,320

ස්ථාවර වත්කම් අලෙවියෙන් ලද ලාභ	(44,849.79)	-
රක්ෂණ නියෝජිතායතන වලින් ලද ආදායම්	393,743.83	430,977
ස්වර්ණාභරණ අලෙවිය	1,024,196.05	274,915
ලෝත වෙලෙද මධ්‍යස්ථානයේ යාව ජීව සාමාජික ගාස්තු	-	137,210
ලෝක වෙළ.මධ්‍ය. සාමාන්‍ය සාමාජික ගාස්තු	-	(85,499)
ප්‍රදර්ශනන වියදම් - විදේශීය (අයකරගැනීම)	58,430,038.53	
	92,356,673.80	**27,871,684**

		2015	2014
30	**පරිපාලන වියදම්**	2015	2014
	දායක මුදල්	720,444.57	931,295.12
	සංග්‍රහ වියදම් - (දේශීය)	587,648.60	431,673.33
	දුරකථන ගාස්තු	7,177,338.74	5,306,097.69
	තැපැල් හා මුද්දර	1,037,203.04	1,028,906.04
	අන්තර්ජාල ගාස්තු	43,852.75	620,736.34
	ටෙලෙක්ස් සහ පැක්ස් ගාස්තු	163,084.86	81,641.33
	අධ්‍යක්ෂ මණ්ඩල වියදම්	831,000.00	813,179.49
	කුලී	5,306,658,.14	4,664,455.68
	විදුලිය	7,919,755.91	10,122,429.03
	වරිපනම් සහ බදු	857,273.40	893,662.00
	පුවත් පත් සහ වාර සගරා	60,117.00	177,141.54
	ජල ගාස්තු සහ බදු	1,179,203.95	1,016,391.13
	ප්‍රවාරක	848,055.00	745,180.00
	ප්‍රවාහන	456,671.20	247,026.22
	රක්ෂණය	2,584,190.56	2,806,267.81
	නීති වියදම්	481,860.73	379,791.75
	වර්ෂය සදහා විගණන ගාස්තු	600,000.00	1,250,000.00
	මිනින්දෝරු ගාස්තු	821,670.00	756,986.08
	කළමනාකාරිත්ව උපදේශක ගාස්තු	52,000.00	954,988.00
	ගොඩනැගිලි නඩත්තු	5,050,957.76	3,703,878.99
	උපකරණ නඩත්තු	1,838,528.95	2.340,845.06

ආරක්ෂක සේවා	9,446,947.50	5,196,008.24
වැඩමුළු සහ පුහුණු (දේශීය)	3,097,941.93	2.816,234.42
වැටලීම් වියදම්	725,806.00	531,567.00
සාමාන්‍ය වෙන්දේසි වියදම්	3,837,976.57	1,081,440.72
පරිත්‍යාග	2,790,000.00	-
පාරිභෝගික වත්කම්	58,980.00	165.157.00
කාර්යාල මිලදී ගැනීම්	2,643,354.12	2,372,153.65
භාවිත ඉඩම් අයිතියේ ක්‍රමක්ෂය	2,364	2.364.00
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	1,289,736.51	1,214,703.56
පරීක්ෂණාගාර සැපයුම්	553,285.43	757,130.00
පාරිසරික වියදම්	5,780,924.06	2.324,645.80
ක්ෂවීම්	29,884,211.03	27,371,311.81
අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය	122,866.00	2058,875.20
ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කුලී	21,753,658.40	15,681,325.14
ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ විදුලිය බිල	1,756,047.44	1,692,345.78
ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ නීතිඥ ගාස්තු	-	87,596.35
මුද්දර ගාස්තු - ලෝක වෙළඳ මධ්‍යස්ථානය	-	729,650.00
රථ වාහන නඩත්තු	4.553,850.53	4,419,448.21
ඉන්ධන සහ තෙල්	6,280,943.24	9,341,431.52
ටයර් සහ ටියුබ්	918,352.60	865,218.58
රථ වාහන රක්ෂණ සහ බලපත්‍ර	2,314,362.84	1,144,737.41
රථ වාහන නැවතුම් ගාස්තු	130.00	30.240.00
රථ වාහන රක්ෂණ වන්දි	(170,934.92)	(89,122.00)
පොදු වියදම්	1,013,592.02	1,888,365.49
ව්‍යාපෘති වියදම්	8,960,050.54	15.381,395.31
බැංකු ගාස්තු	358,498.56	253,764.97
ඉල්ලුම් නොකල ජාතිය ගොඩනැගීමේ බදු	610,797.14	627,948.37
පර්යේෂණ හා සංවර්ධන	-	780,790.00
දේපළ, පිරියත හා උපකරණ හානි පාඩු සඳහා වෙන්කිරීම්	-	-
මැණික් ගරන්නන් සඳහා වූ ශිෂ්‍යත්ව වියදම්	516,000.00	-
	147,716,986.70	**136,149,399**

31	සේවක වියදම්	2105	2014
	වේතන සහ දීමනා	82,345,143.30	78,222.833.25
	වැඩ බැලීමේ දීමනා/අවධානම් දීමනා	74,617.47	718,611.23
	සේවක අර්ථ සාධක යටතට නොගැනෙන වේතන	38,904,948.47	13.691,240.07
	සේවක අර්ථ සාධක අරමුදල	12,742,072.00	12,425,912.94
	සේවක භාරකාර අරමුදල	3,069,547.02	2,502,195.20
	අතිකාල	3,982,488.78	3,751,131.15
	නිවාඩු දින වැඩකිරීම සඳහා ගෙවීම	36,595.50	162,775.30
	ත්‍යාග (රන් පදක්කම්)	209,200.00	221,623.00
	නිවාඩු ප්‍රසාද දීමනා	4,740,074.81	4,611.374.85
	සේවක නිවාස ණය පොලී ගෙවීම්	259,303.71	213,894.47
	සේවක දිරි දීමනා	32,593,369.94	24,131,405.43
	පාරිතෝෂික	8,389,971.97	8,259,512.14
	ගමන් වියදම් (දේශීය)	2,859,955.25	2,226,991.57
	කාර්ය මණ්ඩල නිල ඇඳුම්	736,415.42	246.345.45
	සේවක සුභ සාධන	9,837,982,82	7.311.574.57
	කම්කරු වන්දි	-	241,232.72
	වෛද්‍ය ගාස්තු	9,615,213.00	5.559,197.36
	ප්‍රවාහන දීමනා	8,634,500.00	7,836,900.00
		218,311,400.46	**172,334,751**

32	ප්‍රවර්ධන වියදම්	2015	2014
	ගමන් වියදම් (විදේශීය)	2,622,003.14	11,233,535.09
	ප්‍රදර්ශන වියදම් (දේශීය)	6,714,258.48	29.398,234.05
	ප්‍රදර්ශන වියදම් (විදේශීය)	76,733,818.31	9.700,643.03
	ප්‍රචාරණය (දේශීය)	3,275,781.22	4,377.974.00
	ප්‍රචාරණය (විදේශීය)	945,203.89	-
	අනිකුත්	2,067,246.85	1,678,530
		92,358,312.19	**56,388,916**

33 **ශුද්ධ මුල්‍ය ආදායම්**

පොලී ආදායම්

ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත් මත පොලී	107,155,891.11	50,761,139.46
සේවක ණය පොලී	489,117.51	483,937.31
	107,645,068.83	**61,245,077**
පොලී වියදම්		
කල් බදු ගෙවීම් බැරකම් මත වූ මුල්‍ය පිරිවැය	24,992.00	24,765.00
	(24,992.00)	**(24.765)**
	107,620,076.83	**61,220,312**

34 **ආදායම් බදු වියදම්** **(සටහන් 34.1)**

	2015	2014
වර්තමාන බදු වියදම්	127,866,235.62	146,716.514
පසුගිය වසර සඳහා (ඌණ)/ අධි වෙන්කිරීම් මත ගැලපීම්	(80,923.30)	-
විලම්භිත බදු ගාස්තු/ (වෙනස් කිරීම්) (සටහන් 6)	3,139,971.12	(1.368,972)
	130,925,283.44	**145,347,542**

34.1 වර්තන බදු වියදම් සහ ගිණුම් ලාභ ඉපයීම්	2015	2014
අතර සැසඳීම්		
බදු වලට පෙර ගිණුම් ලාභ	**321,984,714**	**314,942,235**
ඉඩ නොදෙන අයිතමයන් එකතුව	41,953,526	45,902,450
ඉඩ දිය හැකි අයිතමයන් එකතුව	(61,552,099)	(31,959,862)
අනිකුත් ප්‍රභවයන්ගෙන් ආදායම්	(145,838,399)	(84,877,320)
වෙළඳ හෝ ව්‍යාපාරික කටයුතු වලින් ලාභ/ (පාඩු)	**156,547,742**	**244,007,503**
බදු සඳහා අදාල අනිකුත් ආදායම් - පොලී ආදායම්	145,658,399	84,337,320
එකතු ව්‍යවස්ථාපිත ආදායම්	**302,206,141**	**328,344,823**
සුදුසුකම් ලබන ගෙවීම්	(75,000,000)	-
බදු පාඩු උපයෝජනය	(1,634,439)	(4,625,990)

තක්සේරුගත ආදායම්/ බදු අයකල හැකි ආදායම්	**255,571,702**	**323,718,833**
ව්‍යවස්ථාපිත බදු රේටය වූ 28% මත බදු ගාස්තු	63,160,077	90,641,273
දළ ලාභාංශ මත බදු	64,706,159	56,075,241
වර්ෂය සඳහා සාමන්‍ය කටයුතු මත වර්තන බදු	**127,866,236**	**146.716,514**
බදු පාඩු		
ඉදිරියට ගෙනා පාඩු	**-**	**-**
ඇතුලත්වූ පාඩු	-	-
උපයෝජනය කල පාඩු	-	-
ඉදිරියට ගෙනයන පාඩු	**-**	**-**

35. **ප්‍රාග්ධන සහ අනිකුත් බැදීම්**

වාර්තාකරණ කාල පරිච්ඡේදය තුල ප්‍රමාණාත්මක ප්‍රාග්ධන වියදම් හෝ අනිකුත් මූල්‍ය බැදීම් කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොමැත.

ඇහැලියගොඩ ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ වියදම් උපදේශ සහ අනිකුත් වියදම් ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇත.

36. **වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසු ඇතිවන සිදුවීම්**

වාර්තා කරනු ලබන දෙසැම්බර් 31 දින සහ ගිණුම් අත්සන් කරන කාල පරිච්ඡේදය තුල ගැලපීම් සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීමට කාල පරිච්ඡේදයට පසු ඇතිවන සිදුවීම් නොමැත.

37. අසම්භාව්‍ය බැරකම්

අධිකාරියෙහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු හේතුවෙන් පැන නගිනු ලබන නිත්‍යාණුකූල අසම්භාව්‍ය බැරකම් ඇත. වෙන්කිරීම් ලෙස හදුනාගෙන දක්වා තිබේනම් (සටහන් 27), එම බැදීම් පියවා ඉවත් කිරීමේදී සම්පත් ඉවතට ගලායාම සහඵය සාධාරණීකරනය කලහැකි නම් කළමණාකාරීත්වය එය සැලකිල්ලට ගනු ලැබේ.

අධිකාරියෙහි නීති අංශයේ නීති උපදෙස් මත මෙම ගණනය කිරීම් රදා පවතිනු ඇත.

38. **සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම**

අධිකාරියෙහි සම්බන්ධිත පාර්ශවයන් මහා භාණ්ඩාගාරය, රජයට සම්බන්ධිත ආයතන, රජයට අයත් ව්‍යාපාරික ආයතන සහ ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයින් ගෙන් සමන්විත වේ.

මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත මගින් එකතු කර ගන්නා ලද අරමුදල් සහ ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය සමඟ එකතුව ලංකා ජෙමලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සාමාගම (Lanka Gemalogicla Laboratory (pvt) Ltd) පිහිටුවා ඇති අතර 2014 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු. 126,512,567 ක් විය.

38.1 **ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් හා සිදුවූ ගණු දෙණු**

ශ්‍රී ලංකා ගිණුම්කරණප්‍රමිත 24 අනුව "සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම" ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන්හට කෙලින්ම හෝ වක්‍රව ආයතනයේ කටයුතු සැලසුම් කිරීම, මගපෙන්වීම්, පාලනය කිරීම් පිළිබඳ වගකීම පැවරී ඇත. ඒ අනුව ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස වර්ගීකරණය කෙරේ.

ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන්සමග සිදුවූ ගණුදෙණු පහත දක්වා ඇත.	2014	2013
පාරිශ්‍රමික සහ අනෙකුත් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	1,200,000	831,000
සේවා කාලයෙන් පසු ප්‍රතිලාභ		-

38.2 **සම්බන්ධිත පාර්ශවයන් හා ගණුදෙණු**

අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශවයන් හා සිදුකරන ලද ගණුදෙණු පිළිබඳ වැදගත් තොරතුරු පහත දක්වා ඇත.

සම්බන්ධිත පාර්ශවය	වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය සඳහා කරන ලද ගණුදෙණුවල ස්වභාවය	ගණුදෙණුවේ වටිනාකම	ශේෂය (ගෙවිය යුතු) / ලැබිය යුතු
රජයට අයිති ව්‍යාපාරික ආයතන	ස්ථාවර සහතික වල සහ භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය	169,919,145.38	
	ස්ථාවර සහතික සහ භාණ්ඩාගාර බිල්පත් ආපසු ගැනීම්	(55,000,000.00)	1,317,401,767
	ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO)	40,000,000	
	ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO) ආපසු ගැනීම්	-	20,000,000
අනිකුත් රජය හා සම්බන්ධිත ආයතන	කොටස්වල ආයෝජනය	1,200,010	1,200.010

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : අයිඊඑන්/ඩී/එන්ජීජේ/1/15/6	ඔබේ අංකය / உமது இல. / Your No. :	දිනය / திகதி / Date : 2016 ජූලි 28 දින

සභාපති,

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ **2015** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ **1971** අංක **38** දරන මුදල් පනතේ **14(2)(සී)** වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත - 1. ලේකම් - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය.

2. ලේකම් - මුදල් අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No.	අයිර්එන්/ඩී/එන්ජීජේ/1/15/1	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2016 ජූලි 20 දින

සභාපති,

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

ධාරණ අගය ශූන්‍ය වූ පිරිවැය රු.36,310,655 ක වාහන 14 ක් අධිකාරිය විසින් තවදුරටත් ධාවන කටයුතු සඳහා යොදාගන්නා නමුත් එකී වාහනවල සාධාරණ අගයක් පෙන්නුම් කිරීම පිණිස ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17

කල්බදු ක්‍රමයට මිලදීගෙන තිබුණු වාහන 03 කට අදාල සාධාරණ අගය ගිණුම් ගත කිරීම වෙනුවට ඒ වෙනුවෙන් ගෙවා තිබුණු රු.2,228,028 ක කල්බදු වාරිකවල වටිනාකම ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37

ආයතනයේ සේවකයකු විසින් රු. 500,000 ක වන්දියක් ඉල්ලා අධිකාරියට එරෙහිව නඩුවක් පවරා තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබූ අතර අධිකාරියට එරෙහිව පවරා ඇති නඩු සම්බන්ධයෙන් ගිණුම් සටහන්වල අනාවරණය කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ වටිනාකම රු.195,000 ක් වූ සීසීටීවී කැමරා පද්ධතිය ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට අයභාර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) වසර ගණනාවකට පෙර කල්බදු පදනමට ලබාගෙන තිබුණු දැනට භාවිතයේ පවතින වාහන 2 ක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ18 (1) වගන්තිය	ඉඩමක "මැණික් ගැරීමේ අයිතිවාසිකම වෙන්දේසියකින් අත්කරගෙන ඇත්තාවූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් ඒ වෙන්දේසියේදී ගෙවන ලද මිලෙහි ඒ ඉඩමෙන් ලැබෙන මැණික් වෙනුවට යම් රාජ්‍ය භාගයක්ද ඇතුළත් ලෙස සලකුණු ලැබිය යුතුය යන්න" දක්වා තිබුණද අධිකාරිය එම රාජ්‍ය භාග ප්‍රතිශතයන් කුමක්ද යන්න තීරණය කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී බොගවන්තලාව සහ තවත් ඉඩම් වෙන්දේසි කිහිපයකින් රු. 352,774,990 ක පමණ ආදායමක් උපයා තිබුණද ඉන් කිසිදු රාජ්‍ය භාග මුදලක් භාණ්ඩාගාරයට ලබා දී නොතිබුණි.
(ආ) 1971 38 දරන මුදල් පනත	
(i) 11 වගන්තිය	මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන රු. 1,317,401,767 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල හා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.
(ii) 13(8) වගන්තිය	13(7) (ඒ) වගන්තිය ප්‍රකාර 2014 වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් නිකුත් කරන ලද විගණන වාර්තා පාලක මණ්ඩලය විසින් සලකා බැලීමෙන් පසුව ගැනීමට යෝජිත පියවරයන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 1.10.1 වගන්තිය හා 1:11:1 වගන්තිය	පත්වීමක් පෙර දාතම් කිරීමට අමාත්‍යාංශ ලේකම් මගින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු වුවත්, සහකාර අධ්‍යක්ෂ(තක්සේරු/රත්න විද්‍යාඥ) තනතුරේ පත්වීම පෙරදාතම් කිරීමේදී එසේ සිදු කර නොතිබුණි. තවද පෙර දාතම් කිරීම හේතුවෙන් ඊට පෙර පත්කළ නිළධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වයේ වෙනසක් වන්නේ නම් පෙර දාතම් නොකළ යුතුය.එහෙත් ඊට පටහැනිව අධිකාරිය විසින් උක්ත තනතුරේ පත්වීම පෙරදාතම් කර තිබුණි.
(ඇ)	2015 දෙසැම්බර් 09 දිනැති අංක 02/2015 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 01 වගන්තිය	එක් සේවකයෙකුට වර්ෂය සඳහා ගෙවිය හැකි ප්‍රසාද දීමනාව රු. 13,500 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එක් සේවකයෙකුට රු. 55,000 බැගින් ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. ඒ අනුව රු. 10,200,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.
(ඉ)	2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 ඡේදය	නිලවාහන හිමි නිළධාරින්ට අතිරේක ඉන්ධන ලබාදීමේදී අධ්‍යක්ෂ මණ්ඩල හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් තොරව නිළධාරීන් 7 ක් සඳහා අධිකාරියේ ඉන්ධන ඇණවුම් මගින් රු. 338,887 ක ඉන්ධන සපයා දී තිබුණි.
(ඊ)	2011 ජනවාරි 27 දිනැති අංක පීඊඩී 56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	ඉදිරි මාස 6 ක කාලයක් සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදලක් තබාගෙන ඉතිරි සියලු අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.
(උ)	2015 ජනවාරි 12 දිනැති අංක එන්ජීජේජ් 1/1 දරන අභ්‍යන්තර චක්‍රලේඛය	සහන සේවා ගාස්තු යටතේ මැණික් අපනයනය කිරීම අත්හිටුවා තිබියදී අධිකාරිය විසින් ඊට පටහැනිව සහන සේවා ගාස්තු යටතේ මැණික් අපනයනයට අවසර දී තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 28,500,000 ක පමණ සේවා ගාස්තු ආදායමක් අහිමි වී තිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂය සඳහා දිරිදීමනා ගෙවීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සියලුම සේවකයින්ට මාස දෙකක (දීමනා සහිතව) දළ වැටුපට සමාන වන සේ එකතුව රු.19,063,370 ක මුදලක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණි. තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් අධිකාරියේ සියලුම සේවකයින්ට රු. 4,740,075 ක මුදලක්ද ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයේද මෙලෙස අනුමැතියකින් තොරව රු. 12,481,405 ක දිරිදීමනා හා රු. 4,611,375 ක් ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය බදුවලට පෙර රු. 246,984,714 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 314,942,235 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 67,957,521 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ඉඩම් වෙන්දේසි ආදායම රු. 216,063,564 කින් වැඩි වී තිබුණද මැණික් විකිණීම් ආදායම සහ අපනයන සේවා ගාස්තු ආදායම රු.199,362,410 කින් අඩුවීම හා විදේශ ප්‍රදර්ශන වියදම රු. 67,033,175 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ ලාභය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා (2015 වර්ෂය හැර) බදු පසු ශුද්ධ ලාභයේ සැලකිය යුතු වැඩිවීමක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී අධිකාරියේ සමස්ථ දායකත්වය පිළිවෙලින් රු. 273,309,778 ක් රු. 512,421,306 ක් හා රු. 492,320,370 ක් විය. ඒ අනුව 2013 වර්ෂය සමඟ සැසඳීමේදී 2014 වර්ෂයේ දායකත්වය සියයට 87 කින් වැඩි වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම වැඩි වීම සියයට 80 ක් විය.

(ආ) අධිකාරියේ සේවක සංඛ්‍යාව 2012 වර්ෂයේ සිට සියයට 12 සිට 28 දක්වා පරාසයක් තුළ වැඩි වී තිබුණු අතර සේවක පාරිශ්‍රමික ගෙවීමද අඛණ්ඩව වර්ධනය වී තිබුණි. 2012 වර්ෂයේදී සේවක පාරිශ්‍රමික සඳහා ගෙවීම් රු.114,048,303 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය රු. 215,451,445 ක් වූයෙන් 2012 වර්ෂයට සාපේක්ෂව එය සියයට 89 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැය විෂයන් 6 කට අදාල වියදම රු. 84,250,063 කින් අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණු අතර එම වියදම්වල වැඩිවීමේ ප්‍රතිශතය සියයට 39 සිට සියයට 691 දක්වා වූ පරාසයක විය.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත අනුව අධිකාරිය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම, විධිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම වුවත් 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී මැණික් හා ස්වර්ණාභරණ අපනයනය කිරීම සියයට 13 කින්ද බලපත්‍ර නිකුත් කිරීම සියයට 8 කින්ද පහත වැටී තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව අධිකාරියේ ක්‍රියාකාරකම් හතකට අදාල භෞතික ප්‍රගතිය සියයට 0 සිට සියයට 96 ක මට්ටමක විය.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම අනුව වටිනා ලෝහ විශ්ලේෂණ අංශය අයිතම් 27,025 ක් පරීක්ෂා කිරීමෙන් රු 13,800,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද සත්‍ය වශයෙන් අයිතම් 9,605 ක් සඳහා පරීක්ෂණ වාර්තා නිකුත්කර රු. 3,563,677 ක ආදායමක් පමණක් උපයා තිබුණි. ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 33 ක හා මූල්‍ය ප්‍රගතිය සියයට 26 ක අවමයක විය. මෙය ඉකුත් වර්ෂයේ ආදායම හා සංසන්දනයේදී සියයට 24 ක පමණ අඩුවීමකි.

(ඈ) 2014 වර්ෂයේ අයවැය යෝජනාවල හා ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවූ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අමාත්‍යාංශයේ අනුමැතියක්ද නොතිබුණු කොළඹ රන් මධ්‍යස්ථානයේ වටිනා ලෝහ විශ්ලේෂණ රසායනාගාරයක් හා මැණික් පරීක්ෂණ රසායනාගාරයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් අධිකාරිය රු. 2,900,874 ක මූලික වියදමක් දරා තිබුණි. 2014 වර්ෂයේ සැප්තැම්බර් සිට 2015 දෙසැම්බර් 31 දක්වා රන් ප්‍රමාණය අංශයේ රසායනාගාරය විසින් රු. 44,890 ක්ද, මැණික් පරීක්ෂණ රසායනාගාරය විසින් රු. 347,077 ක ආදායමක්ද උපයා තිබුණි. මේ අනුව එකී කාලසීමාව තුළ රසායනාගාර දෙකේ මුළු ආදායම රු. 391,967 ක් වූ අතර ඊට අදාල ගොඩනැගිලි කුලිය රු. 1,478,400 ක් වූයෙන් ආවරණය කරගත නොහැකි වී තිබූ වියදම රු. 1,086,433 ක් විය.

(ඉ) හානියට පත් මැණික් ඉඩම් යාවත්කාලීන කිරීම හා අතහැර දමන ලද පතල් භූමි වැසීම සඳහා රු. 13,000,000 ක අයවැය ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ ඊට අදාළ කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් අයකරන බලපත්‍ර ගාස්තු, අපනයන සේවා ගාස්තු, මැණික් හා ස්වර්ණාභරණ පරීක්ෂණ ගාස්තු හා රාජ්‍ය භාග සම්බන්ධයෙන් ගැසට් නිවේදනයන් ප්‍රසිද්ධ කර මහජනයා දැනුවත් කර නොතිබුණි.

(ආ) මැණික් ඉඩම් වෙන්දේසි කිරීම මගින් බාහිර පාර්ශවයන්ට රජයේ ඉඩම්වල මැණික් ගැරීමේ අයිතිවාසිකම් ලබාදීමට පනතේ 18 (1) වගන්තිය අනුව අධිකාරියට බලතල ඇති නමුත් ඊට පටහැනි ලෙස බොගවන්තලාව මැණික් ගැරීමේ නියමු ව්‍යාපෘතියට අදාල මැණික් ගැරීම් බලපත්‍රය අධිකාරිය නමින් ලබාගෙන තිබුණි.

(ඇ) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 18(2) හා 18(4) වගන්තිය අනුව මැණික් ගැරීමේ ව්‍යාපෘතිවලින් ලැබෙන මැණික් අධිකාරිය වෙත ලබාගෙන ඒවා විකිණීමෙන් ලැබෙන මුදලින් රාජ්‍ය භාගය ලෙස කොටසක් වෙන්කළ යුතු වුවත් හැරණියාවක, බොගවන්තලාව සහ සීතාවක ගඟ සමස්ථ ව්‍යාපෘතිය(අදියර එක හා දෙක) මගින් රු. 528,786,392 ක මුදලක් උපයා තිබූ අතර එයින් රු. 215,204,760 ක් බාහිර පාර්ශව වෙත ගෙවා තිබුණද රාජ්‍ය භාගය ලෙස කිසිදු මුදලක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) මැණික් ගැරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘතියට සම්බන්ධ වන පෞද්ගලික ව්‍යවසායකයා හා අධිකාරිය අතර ලාභ බෙදීමේදී සෑම ව්‍යාපෘතියක් සඳහාම සාධාරණ විනිවිදභාවයකින් යුතු තාර්කික පදනමක් මත එම ප්‍රතිශතය තීරණය කළ යුතුය. එහෙත් පහත ව්‍යාපෘති හතර සැසඳීමේදී ඊට පටහැනි ලෙස එක් එක් ව්‍යවසායකයාට පෞද්ගලික වන සේ ලාභ බෙදාහැරීමේ ප්‍රතිශතය තීරණය කර තිබුණු බැවින් එය විගණනයේදී ප්‍රශ්නකාරී විය.

ව්‍යාපෘතිය	අධිකාරියට හිමි ලාභ ප්‍රතිශතය(සියයට)	අධිකාරිය ලැබූ ලාභය	ව්‍යවසායකයාට හිමි ලාභ ප්‍රතිශතය(සියයට)	ව්‍යවසායකයාට ගෙවූ මුදල
		රු		රු
සීතාවක(අදියර 1)	54.50	135,868,345	25.50	63,571,428
සීතාවක(අදියර 2)	73.25	128,247,450	6.75	11,818,025
හැරණියාවක	30.0	15,948,112	51.0	27,111,790
බොගවන්තලාව	30.0	9,031,670	65.0	19,568,618

(ඉ) රසායනාගාරයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2009 වර්ෂයේදී රු. 92,948,578 ක මුදලක් ලබාදී තිබුණද එම කටයුත්ත විගණන දිනය වූ 2016 ජූලි දක්වාම ඉටු වී නොතිබුණි. එම මුදල නැවත අධිකාරිය වෙත පවරාගැනීමට පාලක මණ්ඩලය තීරණය කර තිබුණද එකී කටයුතු මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි.

(ඊ) අනගි මැණික් (PRECIOUS GEMS) අපනයනය සඳහා මිල කිරීමේ දි එකිනෙක ගල් වශයෙන් හඳුනාගෙන මිල තීරණය කළ යුතු වුවත් එසේ නොමැතිව මැණික් ගල් සමූහ වශයෙන්(LOT) මිල නියමකර අපනයනය කර තිබුණි. මේ නිසා මැණික් තොගයේ අගය නිවැරදිව තක්සේරු නොවීමෙන් විකුණුම් මිල ගණන් අවතක්සේරු වීම නිසා අධිකාරියට අයවිය යුතු සේවා ගාස්තු ආදායම අඩුවීමේ අවදානමක් නිරීක්ෂණය විය.

(උ) අධිකාරිය විසින් 2006 වර්ෂයේදී රු. 1,485,680 ක් ගෙවා මිලදීගෙන තිබූ තොග කටයුතු සඳහා වූ පරිගණක මෘදුකාංග පද්ධතිය දෝෂ සහිතව පැවති අතර ඒ වෙනුවට අතින් ලියූ (Manual) ලේඛණ පවත්වා තිබුණි. මෙම ලේඛණ යාවත්කාලීන නොවීම නිසා එම තොරතුරුද නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(ඌ) වර්ල්ඩ් එක්ස්පෝ ප්‍රදර්ශනය සඳහා අධිකාරිය නියෝජනය කරමින් අපනයනකරුවන් 16 දෙනෙකු සහභාගි කරමින් රු.3,200,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද අපනයනකරුවන් දෙදෙනෙකු සහභාගී වී අධිකාරියට ලැබී තිබුණේ රු. 400,000 ක ආදායමක් පමණි. එහෙත් අධිකාරිය නියෝජනය කරමින් සම්බන්ධ වූ නිලධාරීන් දෙදෙනාගේ සංයුක්ත හා අනියම් දීමනා සඳහා රු. 990,000 ක් වැය කර තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

(අ) සීතාවක ගඟ ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභ බෙදාදීම වෙනුවෙන් පැවති උත්සවය සඳහා දෙහිඕවිට ප්‍රාදේශිය ලේකම් විසින් දරා තිබූ රු.1,107,257 ක වියදම අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මඟින් ප්‍රතිපූරණය නොකර ඇහැලියගොඩ ප්‍රාදේශීය කාර්යාලය විසින් අධ්‍යක්ෂ මූල්‍යගේ සහතිකයකින් තොරව සහකාර අධ්‍යක්ෂ (ක්‍රියාත්මක හා ප්‍රාදේශීය සංවර්ධන) මූල්‍ය සීමාව යටතේ චෙක්පත් 12 කින් ප්‍රතිපූරණය කර තිබුණි.

(ආ) සීතාවක ගඟ මැණික් ගැරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියරේ ආදායමින් රු. 17,420,000 ක් විනිවිදභාවකින් තොරව තෝරාගත් ප්‍රදේශයේ ආබාධිත පුද්ගලයින්ට හා සමෘද්ධිලාභී පුද්ගලයින් සඳහාද රු. 16,246,121 ක් ආගමික ස්ථාන හා ප්‍රාදේශීය සභා වෙතද ගෙවා තිබුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ අංශයට සමාලෝචිත වර්ෂයේ රු. 93,573,214 ක ස්ථාවර වත්කම් මිලදීගෙන තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට සමස්ථ වත්කම් ප්‍රමාණය රු. 123,191,247ක් විය. එයින් රු. 96,942,288 ක වත්කම් 2016 පෙබරවාරි වන විටත් නිශ්ක්‍රීය තත්ත්වයෙන් පැවතුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කළමනාකරණ සහකාරවරු 12 ක්ද ක්ෂේත්‍ර සහායකයින් 06 ක්ද බඳවාගෙන තිබුණි.

(ආ) යාන්ත්‍රික පතල් අධීක්ෂක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබු සේවකයින් 15 දෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ක්ෂේත්‍ර සහායක (අනියම්) ලෙස තනතුරු නාමය වෙනස්කර පත්වීම් ලබා දී තිබුණි.

(ඇ) ඊට අමතරව ක්ෂේත්‍ර සහායක තනතුර සඳහා බඳවා ගෙන තිබුණු අනිකුත් සේවකයන් ක්ෂේත්‍ර රාජකාරිවල යෙදීම වෙනුවට ප්‍රධාන කාර්යාලයේ රාජකාරි ඉටුකිරීමට යොදවා තිබුණි.

(ඈ) අධිකාරියේ බඳවාගැනීමේ කාර්ය පටිපාටිය අනුව කළමනාකාර සහකාර තනතුර සඳහා අදාල සුදුසුකම් නොමැති පුද්ගලයෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු. 380,636 ක් ගෙවීම් කර තිබුණි.

(ඉ) අධිකාරියේ නිළධාරින් ඉදිරිපත් කර තිබුණු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික සත්‍ය ඒවාද යන්න අදාල ආයතනවලින් තහවුරු කරගෙන නොතිබුණි.

(ඊ) විධායක නොවන මට්ටමේ නිළධාරින්ට උසස් වීම්, පුහුණුවීම්, හා වාර්ෂික වැටුප් වර්ධක ලබාදීමේ දි කාර්යසාධනය වාර්ෂිකව ඇගයීමට ලක් කළ යුතු වුවත් 2011 වර්ෂයෙන් පසුව කිසිදු නිළධාරියෙකුගේ කාර්යසාධන ඇගයීමක් සිදුකර නොතිබුණි.

(උ) ශ්‍රි ලංකා පරිපාලන සේවයේ නිළධාරින්ගේ පත්වීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකළ යුතු වුවත් එයට පටහැනිව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ද්විතියන පදනම මත අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පරිපාලන සේවයේ නිළධාරියෙකු පත්කර තිබුණද 2016 ජූලි වන විටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඌ) 2011 වර්ෂයට සාපේක්ෂව ඒක සේවක පිරිවැය සමාලෝචිත වර්ෂය වන විට සියයට 66 කින් පමණ වැඩි වී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

1993 අංක 50 දරණ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 14 වගන්තියේ සඳහන් පහත කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(i) කර්මාන්තයෙහි දියුණුව උදෙසා විශේෂයෙන්ම තාප පිරියම්කරණය හා මැණික් කැපීම පිළිබඳව පුද්ගලයන් පුහුණු කිරීම හා දියුණු කිරීම.

(ii) අනාගතයේ බලාපොරොත්තු විය හැකි මිලදී ගන්නන් අතර මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

(iii) මැණික් නීතිවිරෝධී ලෙස ශ්‍රී ලංකාවෙන් බැහැර කිරීම හා නීති විරෝධී මැණික් ගැරීම් නැවැත්වීම.

(iv) ශ්‍රී ලංකාව තුළ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීමට රජයේ දෙපාර්තමේන්තු අතර අවශ්‍ය සබඳකම් ඇති කිරීම.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරාගැනීමේ ප්‍රගතිය පරීක්ෂාකිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය ස්වාධීන කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබූ අතර අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයේ විගණනය පිළිබඳ වෘත්තීය දැනුම වර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණක පෞද්ගලිකව මධ්‍යස්ථ, සාධාරණ, අපක්ෂපාති ආකල්ප දැරිය යුතු වුවත් අධිකාරියේ අභ්‍යන්තර විගණක එහි සුභසාධක සංගමයේ භාණ්ඩාගාරික ලෙස කටයුතු කිරීම හා රළු මැණික් වෙන්දේසිවල මැණික් තක්සේරු කිරීම් හා ලංසු විවෘත කිරීම් අධීක්ෂණ කාර්යයන් සඳහා සම්බන්ධ වීම මගින් අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වයට එය බාධාවක් බව නිරීක්ෂණය විය.

(ඇ) මැණික් ඉඩම් වෙන්දේසි ආදායම හා මැණික් විකුණුම් (විශේෂ ව්‍යාපෘති) ආදායම විගණනය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම මගින් ඉලක්ක කර තිබුණද ඊට අදාල පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.

5.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

වටිනා ලෝහ විශ්ලේෂණය කිරීමේ රසායනාගාරය සඳහා උපකරණ මිලදීගැනීම වෙනුවෙන් රු. 93,245,566 ක වියදමක් දරා තිබුණද ඒ සඳහා තෝරාගෙන තිබූ සැපයුම්කරුවන් සමඟ නෛතික ගිවිසුම්වලට එළඹ නොතිබුණි. තවද එක් ලංසුවක මිල ගණන් සාවද්‍ය ලෙස වෙනස් කිරීම නිසා රු. 771,600 ක් වැඩිපුර ගෙවා තිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත ආදායම් වියදම් හා තථ්‍ය ආදායම් වියදම් අයිතම දහයක සියයට 20 සිට සියයට 472 ක පරාසයක විචලනයන් නිරීක්ෂණය විය. අයවැය ලේඛනයේ ඇතුළත් නොවූ ආදායම් වර්ග දෙකකින් රු. 2,854,498 ක් උපයාගෙන තිබුණි. සමහර අයිතම සඳහා වියදම් පමණක් දක්වා තිබුණි. මේ අනුව අයවැය ලේඛනය තාත්වික පදනමකින් සකස්කර නොමැති බවත් එය ඵලදායී කළමනාකරණ පාලන උපකරණයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බවත් නිරීක්ෂණය විය.

5.6 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ - මානව සම්පත් හා පරිපාලන තනතුරට බඳවාගැනීමේදී වැටුප් පියවරයන් 8 ක් ඉදිරියෙන් තබා වැටුප් නියම කර 2013 වර්ෂයේ මැයි සිට වැටුප් ගෙවා තිබීම හේතුවෙන් වැඩිපුර ගෙවා තිබූ රු. 597,193 ක වැටුප් 2016 මාර්තු වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9.1 වගන්තියට පටහැනි ලෙස වයස අවුරුදු 60 ඉක්මවූ නිළධාරියෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව 2012 ඔක්තෝබර් සිට පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් කොන්ත්‍රාත් පදනම යටතේ

උපදේශකවරයෙකු ලෙස බදවාගෙන තිබුණි. ඒ වෙනුවෙන් මාසික දීමනාව සහ අනෙකුත් දිරිදීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 867,143 ක්ද ඉකුත් දෙවසර තුළ රු.**1,733,143** ක මුදලක්ද ගෙවා තිබුණි.

(ඇ) අධ්‍යක්ෂ(අපනයන සේවා/අපනයන අලෙවි) තනතුරට බදවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකර අයදුම්පත් කැඳවා තිබූ අතර ඊට අදාළ සම්මුඛ පරීක්ෂණය 2014 ජනවාරි 03 දින පවත්වා තිබුණි. අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා තිබුණු අයදුම්කරුවන් තිදෙනෙකු සිටියදී සුදුසුකම් සපුරා නොතිබූ පුද්ගලයෙකුට අදාළ පත්වීම ලබා දී ඊට අදාළ වැටුප් හා ඉන්ධන දීමනා ලෙස රු. **2,834,838** ක් සමාලෝචිත වර්ෂය වන විට ගෙවා තිබුණි.

5.7 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

යාන්ත්‍රික මැණික් පතල්වලින් විශාල වශයෙන් පරිසර හානි නිරීක්ෂණය වූ අතර එම පතල් වලවල් පුනරුත්ථාපන කටයුතු දුර්වල බැවින් පරිසරයට මෙන්ම ජනයාගේ සෞඛ්‍යයට බරපතල හානි උදා වී තිබුණි. තවද කුඹුරු ඉඩම් ආශ්‍රිත මැණික් පතල්වලින් එම ඉඩම් වගා කටයුතුවලට යොදාගැනීමට නොහැකි වීමේ අවදානම්ද උදා වී තිබුණි.දෝන පතල් වලින් රත්නපුර දිස්ත්‍රික්කයේ නායයාමේ අවදානමක්ද නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) **ගිණුම්කරණය**
ප්‍රාදේශීය කාර්යාල සඳහා පාලන ගිණුම් නඩත්තු කර නොතිබූ අතර ජ'නල් සටහන් වලට අදාල සංලක්ෂයන් විධිමත් ආකාරයට දක්වා නොතිබුණි.

(ආ) **වාහන පාලනය**
ධාවන සටහන්වල මුල් පිටපත් මාසිකව විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර එක් එක් වාහනය වෙනුවෙන් වාහන ධාවන පිරිවැය වාර්තා සකස්කර නොතිබුණි.

(ඇ) **මානව සම්පත් කළමනාකරණය**
කළමනාකරණ සේවා චක්‍රලේඛවලට පටහැනිව බදවාගැනීම් හා උස්සවීම් සිදුකිරීම් නිරන්තරයෙන් නිරීක්ෂණය වූ අතර අවිධිමත්ව සේවය අවසන්කිරීම් හේතුවෙන් අධිකාරියට එරෙහිව නඩු ගොනු වීම නිසා ඒ සඳහා කාලය හා මුදල් වියදම් වීම. කාර්යාලීය රාජකාරි හා ක්ෂේත්‍ර රාජකාරි සඳහා සේවකයින් අනුයුක්ත කිරීමේදී සේවක සුදුසුකම් පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ඈ) **මෙහෙයුම් කටයුතු පාලනය**

(i) **විදේශ ප්‍රදර්ශන සංවිධානය**

අනුමත අය වැය සීමා ඉක්මවා වියදම් දැරීම හා ප්‍රදර්ශන සංවිධාන කටයුතු සඳහා සුදුසුකම් නොමැති හා ප්‍රවර්ධන කටයුතු විෂයට බාහිර නිළධාරීන්ද විදේශගත වීම් දක්නට තිබුණි.

(ii) **ඉඩම් වෙන්දේසි හා මැණික් වෙන්දේසි**

මැණික් පවතින රජයේ ඉඩම් වල මැණික් ගැරීමට ඉඩම් සඳහා නිදහස්කර ගැනීමේදී අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු හා නෛතික කටයුතු දුර්වල මට්ටමක විය.

(iii) **මැණික් අපනයන**

මැණික් අපනයනයේදී මැණික් ගල් වටිනාකම් විශාල ලෙස අවතක්සේරු කිරීම නිසා අධිකාරියේ සේවා ගාස්තු ආදායම් අඩු වීම.

(ඉ) **තොග පාලනය**

තොග ලෙජරයේ ශේෂය හා භෞතික තොගය අතර ඌනතාවයන් හා අතිරික්තයන් පැවතුණි. ගබඩා අංශය ගිණුම් අංශයේ ගණකාධිකාරීවරයෙකු යටතේ ක්‍රියාත්මක විය යුතු වුවද අධිකාරියේ භාණ්ඩ මිලදීගැනීම් හා අබලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීම ගබඩා අංශයත් පවත්වාගෙන යාම සැපයුම් කළමනාකරු යටතේම සිදුකර තිබුණි. මේ හේතුවෙන් තොග පාලනය සම්බන්ධ අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති